# මුන්නේශ්වරම මහා දේවාලය හා වාර්ෂික පෙරහැර මංගල්‍යය සමඟ බැඳුණු රාජකාරි ක්‍රමය සහ එහි නව ප්‍රවණතා

උපාලි වීරකෝන්

## හැඳින්වීම

ආගම සහ ආගමික ඇඳහිලි පුද පිළිවෙත් හී මුලාරම්භය කවදා කෙසේ සිදුවූයේ ද යන්න පිළිබඳව නිශ්චිත සාක්ෂි සටහන් නොපවතී.[1] මානවයාගේ ඉතිහාසය ආගමේ ඉතිහාසය වන බැව් මැක්ස් මුලර් (Max Muller 1823-1900) ගේ අදහස විය. ඔගස්ට් කොම්ට් (August Comte, 1798-1857) ගේ සමාජ පරිණාමය පිළිබද අවධි විග්‍රහයේ පළමුව දැක්වූ දේවවාදී අවධිය හෙවත් කල්පිත අවධියේ (theological or fictitious stage). මිනිස්සු ස්වභාව ධර්මය හා සමඟ නිරන්තර සබඳතා ගොඩනඟා ගනිමින් සිය ජීවිත පවත්වා ගෙන යාමට උනන්දු විය. එසේම ස්වභාවික සංසිද්ධීන් (නාය යෑම, ගංවතුර ගැලීම, සුළි සුළං) වැනි දෑ අධිස්වභාවික (Supernatural) බලවේග විසින් සිදුකරනු ලබන දේවල් ලෙස සැලකූහ.

[1] මෙම අධ්‍යයනය සිදුකරන ලද්දේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයට වෙන් කරනු ලබන වාර්ෂික පර්යේෂණ අරමුදල් පිරිනැමීමේ අනුග්‍රහය යටතේ ය. මෙම ලිපිය සම්පාදනය කරන ලද්දේ ප්‍රධාන පර්යේෂණය සිදුකරන අතර දී හඳුනාගත් විශේෂිත මාතෘකාවක් ඔස්සේ ය. ප්‍රධාන අධ්‍යයනය වූ "සමාජ සහජීවනය සහ සිංහල දමිළ අන්තර් විවාහය" යන පර්යේෂණ යෝජනාව සකස් කිරීමේ දී මහාචාර්ය ආර්. එම්. ඩී. බී. හේරත් මහතාගේ අදහස් හා යෝජනා ප්‍රයෝජනවත් විය. විශේෂයෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයන තොරතුරු රැස් කිරීමේ දී සීමිත කාලයක වුවද කැපවීමක යෙදෙමින් සහභාගි වූ සම්මානිත මහාචාර්ය කාළිංග ටියුඩර් සිල්වා මහතා ස්තුති පූර්වකව සඳහන් කළ යුතුය.

ආගම කිසියම් ක්‍රම රටාවකට පරිණාමය වන බැව් ඊ. බී. ටයිලර් (Edward B.Tylor 1832-1912) නම් සමාජ මානව විද්‍යාඥයාගේ පැහැදිලි කිරීම විය. එම පරිණාමය සර්වාත්මවාදය (Animism), බහුදේවවාදය (Polytheism) සහ ඒකදේවවාදය (Monotheism) ලෙසට සිදුවේ. මිනිසා ලබා ගන්නා ඥාන සම්භාරය අනුව ආගම විකාශනය වන බවත් ආගම යන්න අධි ස්වභාවික සංසිද්ධියක් ලෙසත් ටයිලර් පෙන්වා දුන්නේය. ස්පෙන්සර් (Herbert Spencer 1820-1903) විසින් ප්‍රාථමික සමාජයේ ජීවත් වු මිනිසුන් තමන් ජීවත්වන අවට පරිසරයේ ඇති ස්වභාවික දේවල් මෙන්ම වස්තුන් සියල්ල දෙවියන් විසින් නිර්මාණය කරන ලද ඒවා බව පවසන ලදී. ඩර්කයිම් (Emile Durkheim 1858-1917) ප්‍රාථමික මිනිසා කිසියම් පාරිශුද්ධ (Sacred) යැයි සැලකෙන දෙයකට (පැලෑටියක්, සතෙක් හෝ එහි අවයවයක් ආදි වශයෙන්) වැදුම් පිදුම් කිරීමට යොමුවීමෙන් ආගම බිහිවු අන්දම පැහැදිලි කළේය. එහිදී කිසියම් භෞතික වස්තුවක් මුලිකකොට සිදුකරන වැදුම් පිදුම් පිළිවෙත් තෝටම වන්දනය ලෙස පැහැදිලි කළ අතර ආගමික පිළිවෙත් වලින් සිදුවන්නේ පුද්ගලයා විසින් තමන්ගේම සමාජයට වන්දනා කිරීම බව පෙන්වා දුන්නේය (Durkheim 1915).

රැඩ්ක්ලිප් බ්‍රවුන් (Alfred Radcliffe-Brown 1881-1955) සිය ආගම පිළිබඳ විග්‍රහය සඳහා අන්දමන් දූපත්වාසීන්ගේ අධ්‍යයන තොරතුරු භාවිත කළේය. එහිදී මිනිසුන්ගේ ආගමික චර්යාව සඳහා අහස, වනාන්තරය, මුහුද හා මළවුන්ගේ ආත්ම යනාදි ස්වභාවික හා අද්භූත දේවල් සම්බන්ධ වන අයුරු හඳුනාගෙන තිබේ. මෙම ස්වභාවික සංසිද්ධිවල වල පුද්ගලාරෝපණය ලෙස සැලකෙන ස්වභාවික ආත්මයන්

එහි පවතින බව රැඩ්ක්ලිප් බ්‍රවුන්ගේ පැහැදිලි කිරීම විය ( Radcliffe-Brown 1922).

විවිධ සමාජ මානව විද්‍යාත්මක පැහැදිලි කිරීම් වලින් ස්ඵුට වන්නේ ප්‍රාථමික මිනිසා තමන්ට වටහා ගත නොහැකි සංසිද්ධි තේරුම් ගැනීම සඳහා ඊට යම් යම් බලවේග ආරෝපණය කොට පසුව ඒවාට වන්දනා මාන කිරීමට පෙළැඹීම තුළින් ආගම බිහිවූ අන්දමයි. මෙම පසුබිම ආගමික පුදපූජා පිළිවෙත් සමුදායක් ඇතිවීමට ද මුල්වී තිබේ.

වර්තමානයේ බොහෝ ආගමික ඉගැන්වීම් වලදී අධි බලයක් සහිත පුද්ගලයින් හා දේවල් ගැන සඳහන් වේ. මෙය පුද්ගල ඇසට නොපෙනෙන්නා වූ එක්තරා ආකාරයක දිව්‍යමය බලයකි. දෙවි දේවතාවුන් ඇදහීම හා වන්දනය සිදුවන්නේ ද එම සංසිද්ධිය තුළම ය. දෙවි දේවතාවියන් හින්දු ආගමේ ප්‍රධාන වූත් ජනප්‍රිය වූත් සංකල්පයකි (Gombrich and Obeyesekere 1988, Pfaffenberger 1979). දමිළ හින්දුන් විසින් දෙවියන් හා ආගම ඇදහීම එකම ක්‍රියාවලියක් ලෙස සිදුකරන ලබන බැව් සමාජ මානව විද්‍යාත්මක තොරතුරු වලින් පෙන්වා දෙනු ලැබේ. එය ඒ ඒ මිනිසුන්ගේ අවශ්‍යතාව අනුව සිදුකරන බව ද පැහැදිලි ය. ශ්‍රී ලාංකියන් විසින් දෙවි දේවතාවියන් ඇදහීම අතීතයේ සිටම සිදුකරනු ලැබූ එකක් වන අතර දකුණු ඉන්දියානුවන් ලක්දිවට පැමිණීමෙන් පසුව එය තවදුරටත් ප්‍රචලිත විය. මෙරට වැසියන් දෙවි දේවතාවියන් උදෙසා දේවාල ඉදිකර ඊට විවිධ වත්පිළිවෙත් හා පුද පූජා පැවැත්වීම ගැන තොරතුරු සඳහන් වේ (ධර්මදාස හා තුන්දෙනිය, 1994, 22). දෙවි දේවතාවියන් ඇදහීම හින්දු ආගමෙන් ම උගන්වා තිබෙන්නකි. ලෝකයේ මැවුම්කරු වන්නේ මහා බ්‍රහ්මයා. ඔහු සර්ව බලධාරී දෙවියන් වෙයි. ඔහුගේ කැමැත්තකට ලෝකය නිර්මාණය වී ඇත. ඒ අනුව දෙවි

දේවතාවියන් රාශියක් බ්‍රහ්ම සංකල්පය ඔස්සේ ඉදිරිපත් කර තිබේ (Keshavadas 1988).

මුන්නේශ්වරම කෝවිල (හලාවත), කෝනේශ්වරම් කෝවිල (ත්‍රිකුණාමලය), නගුලේශ්වරම් කෝවිල (කීරිමලේ), තිරුකේතීශ්වරම් කෝවිල (මන්නාරම) සහ රාමේශ්වරම් කෝවිල (ඉන්දියාව) යන කෝවිල් පහ, ශිව දෙවියන් වෙනුවෙන් මෙම කලාපයේ (ශ්‍රී ලංකාව ද ඇතුළුව) ඉදි කරන ලද, පෞරාණික ම කෝවිල් ("ඊශ්වරම්") ලෙස සැලකේ. මෙම ප්‍රාදේශීය හින්දු කෝවිල් සංකීර්ණය අවම වශයෙන් ක්‍රිස්තු වර්ෂ 1000 සිට පැවත එන බව හා ඉන්දියානු වීර කාව්‍යයක් වන රාමායණ කතා පුවත් සමඟ මෙම කෝවිල් සම්බන්ධ වන බවත් විශ්වාස කෙරේ. දෙමළ භාෂාවෙන් 'මුන්'යන්නෙහි තේරුම බොහෝ කලකට පෙර සහ 'ඊශ්වරම්' යන්නෙන් අදහස් වන්නේ ශිව දේවාලයයි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර කේන්ද්‍රගතව පුරාණ හින්දු කෝවිල් රැසක් දැකගත හැකිය. විශේෂයෙන් ම හින්දු නොවන ආගමික ලබ්ධිකයින් විසින් හින්දු කෝවිල් ආශ්‍රිත දෙවි දේවතාවුන් ඇදහීම හා වන්දනය ගැන සිදුකරන ලද සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයන (Gombrich & Obeyesekere 1983, Obeyesekere 1981 & 1988, Bryan Pfaffenberger 1979) තුළින් දේව ඇදහිලි හා විශ්වාසයන් හි ඓතිහාසික මුලයන් පිළිබඳ තොරතුරු හඳුනාගත හැකිය.

මෙම ලිපියට අදාළ වු තොරතුරු ගවේෂණය හලාවත මුන්නේශ්වරම ප්‍රදේශයේ ඇති මුන්නේශ්වරම් කෝවිල හෙවත් මහා දේවාලය ඇසුරින් සිදුකළ එකකි. මුන්නේශ්වරම් කෝවිල (මුනි ඊශ්වර කෝවිල්) හා සුළු භද්‍රකාලී කෝවිල මෙම පුදබිමෙහි පිහිටා ඇත. 17වන සියවසෙහි පෘතුගීසී ජේසුස් නිකායිකයින් විසින් පුදබිමෙහි බලය

මුළුමනින් ම බිඳ දැමුව නමුත් අදටත් දමිළයින් හා සිංහලයින් අතර මෙම පුදබිම ඉතාමත් ජනප්‍රියව පවතියි (Bastin 2002).

හලාවත මුන්නේශ්වරම් කෝවිල ශ්‍රී ලංකාවේ ඇති ජනප්‍රිය හින්දු කෝවිලක් ලෙස ප්‍රසිද්ධ ය. සිංහල හා දමිළ මිශ්‍ර ජනගහණයක් සහිත වූ දමිළ කොට්ඨාසය (දෙමළ පත්තුව) ට අයිති මුන්නේශ්වරම ග්‍රාමයේ මෙම මුන්නේශ්වරම හින්දු කෝවිල පිහිටා තිබේ. පෘතුගීසීන් විසින් විනාශයට පත් කෙරුණු මුන්නේශ්වරම කෝවිල 1753 වසරේ දී නැවත මුලින් පැවති තත්ත්වයට ගොඩනැගුණු අතර 1875 වසරේ දී කුමාරස්වාමි කුරුක්කල් විසින් නැවත ප්‍රතිසංස්කරණය කරන ලදී. ඊශ්වර මහාදේවාලය මුල් කරගෙන තවත් පරිවාර දේවාල සමූහයකින් ද සමන්විත වන මෙම දේව පුරවරය හින්දු භක්තියන්ගේ සිද්ධස්ථානයක් වශයෙන් ප්‍රසිද්ධ වී තිබුණත් හින්දුන් මෙන්ම බෞද්ධයින් ඇතුළු අන්‍ය ආගමිකයින් ද එක පෙළට සිට දෙවි පිහිට පැතීම මෙහි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි. ශිව දේවාලය හෙවත් මහා දේවාලය (ඊශ්වර කෝවිල) ප්‍රධාන කොටගත් මෙම දෙවි පුරවරයෙහි භද්‍රකාලි අම්මාන් කෝවිල හෙවත් කාලි දේවාලය, ගම්භාර අයියනායක මහා දේවාලය, කතරගම දේවාලය, ගණපති කෝවිල හෙවත් ගණ දේවාලය, සොහොන් කාලි අම්මාන් කෝවිල හෙවත් සොහොන් කාලි දේවාලය ආදි වශයෙන් විවිධ දෙවියන් උදෙසා කැපවුණු දේවාල රාශියක්ම පිහිටා ඇත (විජේරත්න 2013: 01).

මෙම කෝවිල් ආශ්‍රිත පූජා බිමෙහි පුරාතනයේ පටන් චාරිත්‍රානුකූලව දෛනික පුද පූජා පැවැත්වේ. මෙහි වන්දනයට පැමිණෙන බැතිමත්තු මෙම පුදපූජා වලට සම්බන්ධ වෙති. ඊට අමතරව මහා දේවාලය මුල්කොට වාර්ෂිකව මහා පෙරහැර මංගල්‍යය උත්සවශ්‍රීයෙන් පැවැත්වේ. පෙරහැර සමයේ දී ප්‍රදේශය උත්සවශ්‍රීය පිළිබිඹු කරවන ආකාරයට සැරසිලිවලින් සැකසීම, විනෝද හා සංදර්ශන

කුටි ඉදි කිරීම සහ ආපන ශාලා ඇතුළු විවිධ වෙළඳ කුටි විවෘත කිරීම ඔස්සේ බහුවාර්ගිකත්වය මැනවින් ඉස්මතු කෙරේ. එමෙන් ම පෙරහැර චාරිත්‍රය හා බැඳුණු රාජකාරි ක්‍රමය ක්‍රියාත්මක වීම සහ එහි නව ප්‍රවණතාවන් ද දක්නට ලැබේ. මහා දේවාලයෙන් පැවරූ ඉඩම් වෙනුවෙන් මිනිස්සු සිය රාජකාරිය ඉටු කිරීමට ක්‍රියා කරති.

ඒ අනුව මුන්නේශ්වරම මහා දේවාලයේ පෙරහැර මංගල්‍යය හා බැඳුණු රාජකාරී ක්‍රමය සහ එහි නව ප්‍රවණතා පිළිබඳ තොරතුරු විග්‍රහයක් ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණාත්මක ලිපියේ පරමාර්ථය වේ.

**අධ්‍යයන ක්ෂේත්‍රය**

හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මෙහි අධ්‍යයන ක්ෂේත්‍රයයි. ග්‍රාම නිලධාරි වසම් ගණන 49 ක් (සිතියම 01) වන අතර ඊට අයිති ගම්මාන සංඛ්‍යාව 169 කි. මුළු පවුල් සංඛ්‍යාව 20,770 ක් වන අතර මුළු ජනගහණය 75,903කි. මුළු ජනගහණයෙන් ස්ත්‍රී ජනගහණ ප්‍රතිශතය 52% ක් වන අතර පිරිමි ප්‍රතිශතය 48% කි. ජාතීන් අනුව ජනගහණය බලන විට සිංහල 61,910 ක් ද, දමිළ 6,379 ක් ද, මුස්ලිම් 6,969 ක් ද, බර්ගර් 559 ක් සහ වෙනත් 86 ක් ද වශයෙන් වේ. ආගම් අනුව ජනගහණය බලන විට කතෝලික 46% ක් ද, බෞද්ධ 37% ක් ද, ඉස්ලාම් 9% ක් ද, හින්දු 7% ක් හා වෙනත් 1% ක් ද වශයෙන් වේ.

**සිතියම - 01**




(හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2020).

අධ්‍යයන ක්ෂේත්‍රයට අයිති බෞද්ධ පන්සල් ගණන 25 ක් ද, ක්‍රිස්තියානි කතෝලික දේවස්ථාන 22 ක් ද, කතෝලික නොවන දේවස්ථාන 14 ක් ද, හින්දු දේවස්ථාන 14 ක් ද, මුස්ලිම් පල්ලි 12 ක් ද වශයෙන් තිබේ (හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2020).

**පර්යේෂණ අරමුණ**

මෙම අධ්‍යයනයේ අරමුණ මුන්නේශ්වරම මහා දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍යය තුළින් හෙළිවන කුල ක්‍රමය හා බැඳුණු

රාජකාරි ක්‍රමය සහ එහි නව ප්‍රවණතා පැහැදිලි කිරීම ය. මෙහිදී කුලය ඉඩම්, අයිතිය සහ රාජකාරි ක්‍රමය එතිනෙකට මහා දේවාලය සමඟ සම්බන්ධ වන්නේ කෙසේද යන්න පරීක්ෂා කරනු ලැබේ. මහා දේවාලය හා සබැඳි කුලයට අදාල රාජකාරීය සහ එම කුලය නියෝජනය කරන මිනිසුන් පදිංචිව සිටින ගම සම්බන්ධ ලිඛිත තොරතුරු ශ්‍රී මුන්නේශ්වරම වර්ණනාව[2] මුලාශ්‍රයෙන් හදුනා ගන්නා ලදී.

ඒ අනුව මහා දේවාලයේ රාජකාරිය කරන මිනිසුන් අතර පැහැදිලි කුල ධූරාවලියක් (caste hierarchy) දක්නට ලැබේ. එසේම මහා දේවාලයේ රාජකාරිය ට අදාල කුලය පැහැදිලිව හදුනා ගත හැකිය. ඒ හා සම්බන්ධ වර්තමාන තොරතුරු 2022 වර්ෂයේ ශ්‍රී මුන්නේශ්වරම වාර්ෂික නිකිණි මහ පෙරහැර උත්සව පත්‍රිකාවෙන් හඳුනා ගැණුනි (බලන්න ඇමුණුම-1, පිටුව 311). ඒ අනුව මුන්නේශ්වරම මහා දේවාලයට අයිති ඉඩම්වල පදිංචි මිනිසුන් වාර්ෂික පෙරහැර මංගල්‍යයට කෙබඳු දායකත්වයක් ලබා දෙන්නේ ද සහ ඊට කුල ධූරාවලියේ දායකත්වය කෙසේ ද යන්න හඳුනා ගැනීම සිදු කෙරේ. ඊට අමරතව මහා දේවාල පෙරහැර දිය කැපීමේ උත්සවයෙන් අවසන් වීමෙන් පසුව නව පෙරහැරක් නැවත ඊට පසු දවසේ සිට ආරම්භ වේ. එසේ නව පෙරහැර පැවැත්වීමට බලපා ඇති හේතු විමසනු ලැබේ. ඒ අනුව මුන්නේශ්වරම මහා දේවාල පෙරහැරේ ස්ථාවර තත්ත්වයන් සහ නව ප්‍රවණතා පරීක්ෂා කිරීම මෙම අධ්‍යයන ලිපියේ අරමුණ වේ.

## ක්‍රමවේදය

මුන්නේශ්වරම මහා දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍යයේ විශේෂ ලක්ෂණ කිහිපයකි. දමිළ සිංහල මිනිසුන් ජනවාර්ගික බේදයෙන්

[2] ශ්‍රී මුන්නේශ්වරම වර්ණනාව යනු බ්‍රහ්ම ශ්‍රී සෝමස්කන්ද කුරුක්කාල් විසින් මුන්නේශ්වරම කෝවිල ගැන රචනා කර ඇති ලේඛණයකි.

තොරව පෙරහැර පැවැත්වීමට දායක වීම ප්‍රධාන කරුණකි. එසේ ම අවුරුද්දේ එක් මාසයක කාලයක් අඛණ්ඩව පෙරහැර උත්සවය පැවැත්වීම තවත් එකකි. මූලාශ්‍ර කෘතිවල දැක්වෙන අන්දමට හින්දු බ්‍රාහ්මණ පූජකයින් පූජා පවත්වන බහුතරයක් සිංහල බෞද්ධ ගම්මාන වල ජනයා පෙරහැර පවත්වන ලංකාවේ එකම දේවාලය ලෙස මුන්නේශ්වරම දේවාලය (ඩේවිඩ් 2012: 153) යැයි හැඳින්වීම තවත් කරුණකි.

එක් එක් ජනවර්ග වලට හා ආගම් වලට අයිති මිනිසුන් මුන්නේශ්වරම් පෙරහැරට දායකත්වය ලබා දීම සහ සක්‍රීයව පෙරහැරට සම්බන්ධ වීම සිදුවේ. අධ්‍යයනයට අදාල ප්‍රාථමික දත්ත මහා දේවලයට අයිති ඉඩම්වල දැනට පදිංචි ව සිටින මිනිසුන්ගෙන් ද, ද්විතීයික තොරතුරු මුන්නේශ්වරම ගැන මෙතෙක් සිදුකර තිබෙන පර්යේෂණ ග්‍රන්ථ සහ අනෙකුත් කෘති පරිශීලනයෙන් ලබා ගැණුනි. අරමුණු සහගත නියැදීම් ක්‍රමයෙන් අධ්‍යයන නියැදිය තෝරා ගත් අතර ඊට දමිළ හා සිංහල ගෘහ මූලික පිරිමින් සහ කාන්තාවන් ඇතුළත් විය. මහා දේවාල පෙරහැර ආරම්භක මුල් දින දෙකක් ඇතුළත සිදුකළ සහභාගි නිරීක්ෂණයෙන් අනතුරුව නියැඳිය තෝරා ගතිමි. දේවාල ඉඩම්වල පදිංචි දමිළ, සිංහල සියලු දෙනාට පෙරහැර සමය ඉතා කාර්ය බහුල කාලයක් විය. ඔවුන් වැඩියෙන් කැමති වූයේ කෝවිල් බිමේ දී සාකච්ඡා කිරීමට ය. ආගමානුකූල භාවිතය හා හැසිරීම් රටාව ඊට හේතුවක් බැව් පැහැදිලි විය. තොරතුරු රැස් කිරීමට ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කෙරිණි. ඊට අමතරව දේවාල පරිශ්‍රය ආසන්නයේ තිබෙන ශ්‍රී පුෂ්පාරාම විහාරයේ විහාරවාසී ස්වාමීන් වහන්සේ, මහා දේවාලයේ ප්‍රධාන පරිපාලන භාරකාරත්වය, පෙරහැර උත්සවයේ සංවිධාන වගකීම දරන අය, දේවාලයේ පූසාරි තනතුර හොබවන සහ පෙරහැර නරඹන පිරිස හැසිරවීම සිදුකරන ස්වේච්ඡා

සංවිධාන ප්‍රධාන නිළධාරී යන අය මෙම අධ්‍යයනයේ මූලික තොරතුරු සපයන්නෝ වූහ. ඊට අමතරව නිරීක්ෂණය ආශ්‍රයෙන් තොරතුරු ලබා ගන්නා ලදී.

ක්ෂේත්‍ර අධ්‍යයනය සති අන්තයේ දිනවල සහ රජයේ නිවාඩු දිනවල පමණක් සිදුකළ එකක් බැවින් දින 28ක කාලයේ සමස්ත පෙරහැර ම සහ අනතුරුව පවත්වන නව පෙරහැර අංග මුළුමනින් ම ආවරණය කිරීමට නොහැකිවීම සීමාකමකි. පෙරහැර පැවැත්වෙන අවස්ථාවේ වෙන් කරගත් කාලය තුළ අධ්‍යයනයට අදාල ලබා ගතිමි. පෙරහැර නිරීක්ෂණය කිරීමට නොහැකි වු දිනවල පෙරහැරට දායකත්වය ලබාදුන් අදාල කුලයේ තෝරාගත් ගම් වැසියන්ගෙන් තොරතුරු ලබා ගතිමි. සියලු ගම් නියෝජනය කරන පුද්ගලයින් සමග සාකච්ඡා කිරීමට කාලය ප්‍රමාණවත් නොවීය. ඊට අදාළ තොරතුරු අධ්‍යයනයේ මූලික තොරතුරු සපයන්නන් මගින් ලබා ගන්නා ලදී.

**සාහිත්‍ය විමර්ශනය**

බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික යනාදි වශයෙන් වු විවිධ ආගම්වල සම්මිශ්‍රණය ලාංකික සමාජ සන්දර්භයේ බහු සංස්කෘතිකත්වය (Multiculturalism) නිරූපනය කෙරෙන මූලික අවස්ථාවෙකි. මෙහිදී එක් ජනවර්ගයක ට අනන්‍ය වු ආගමක් පැවතිය ද අන්‍ය ආගමක් විශ්වාස කිරීම හෝ ඇඳහීම ට බාධා නොපවතියි. සිංහලයන් හින්දු ආගමේ ඉගැන්වෙන දෙවි දේවතාවුන් පිළිබඳ විශ්වාසය හා ඇඳහීම සාමාන්‍ය දෙයකි. එසේම අන්‍ය ආගමිකයින් බෞද්ධ සිද්ධස්ථාන වෙත පැමිණීම හා වන්දනා මාන කිරීම දැකිය හැකිය. මෙරට හින්දු ආගම භාවිතය සම්බන්ධයෙන් නොයෙකුත් අවස්ථාවල අවධානයට යොමු වු දෙයකි. බෞද්ධාගම හා හින්දු දහමේ සම්මිශ්‍රණය පිළිබඳව අධ්‍යයන රැසක් මෑත කාලීන ව විද්වතුන් විසින් සිදුකොට තිබේ. පොදුවේ ගත් කළ සිංහල

දමිළ මිනිසුන් අතර සහජීවනය ගොඩනැඟීමට අන්තර් ආගමික ක්‍රියා වැදගත් ප්‍රවේශයක් සපයා තිබේ. විශේෂයෙන්ම අතීත ලංකාවේ රාජ්‍ය පාලනය ඉන්දීය සම්භවයක් සහිත රජවරුන් යටතට නතු වීම ඔස්සේ මෙරට හින්දු ආගමේ ව්‍යාප්තිය වේගවත් විය. 18 වන ශතවර්ෂයේ ඉන්දියන් සම්භවයක් ඇති නායක්කර් වංශික රජවරුන් විසින් ඉන්දියාවෙන් හින්දු දෙවිවරු ඔවුන්ගේ පාලන ප්‍රදේශය වු මහනුවරට ගෙනවිත් දළදා මාළිගා පරිශ්‍රයේ තබා පුද පූජා පැවත් වු අතර මෙහි ප්‍රධාන බෞද්ධ විහාරස්ථාන වු මල්වත්ත සහ අස්ගිරිය යන විහාරයන් හී භික්ෂුන් වහන්සේලා මෙම දේව වන්දන අවස්ථාවලට සහභාගි වුහ (Seneviratne 1978).

19වන ශතවර්ෂය ශ්‍රී ලංකාවේ හින්දු කෝවිල් පිළිබඳ මූලික විද්‍යාත්මක හැදෑරීම් සිදුකළ කාල පරිච්ඡේදයකි. අනතුරුව 20වන සියවසේ අගභාගයේ ඇතිවු සිවිල් යුධ ගැටුම (1983-2009) මෙරට හින්දු කෝවිල් පිළිබඳ අවධානය වැඩිවීමට හේතුවිය. ශ්‍රී ලාංකික බෞද්ධයන්ගේ හින්දු පිළිවෙත් පිළිබඳ තොරතුරු Bastin විසින් මුන්නේශ්වරම හින්දු කෝවිල ඇසුරින් ඉදිරිපත් කර තිබේ. මහා දේවලයේ පුජා කටයුතු දමිළ බ්‍රාහ්මණ පුජකවරු (පුසාරිවරු) විසින් සිදුකරනු ලබයි. මෙහි බැතිමතුන් සලකන විට සිංහලයින් බොහෝ වෙති. මුන්නේශ්වරම් කෝවිල් ස්ථානය ජනවාර්ගික ආතතීන් හා ලබ්ධීන් වලට යොමුවන සාධක පවතින අතර දේශපාලන මැදිහත්වීම් වර්ධනය වෙමින් පවතියි. නමුත් මෙම ස්ථානයෙහි පවතින බලය පිළිබද විශ්වාසය අභිලාෂකාමී දේශපාලනඥයන් සහ ව්‍යවසායකයන් රැසක් ආකර්ෂණය කර තිබේ (Bastin 2002).

මඩකලපුව අසල පිහිටි මන්ඩුර් කෝවිල ආශ්‍රිත හින්දු ආගමික වත් පිළිවෙත් සහ බල අරගලය පිළිබඳ විග්‍රහයක් Whitaker (1999) විසින් දක්වා ඇත. මෙරට පැවති සිවිල් යුද්ධයේ බලපෑම ඉතා අවම වීම සහ

කෝවිලේ ස්කන්ධ මුරුගන් දෙවියන් මුල්කොට පවත්වන වාර්ෂික ආගමික උත්සව නිසි අන්දමට සිදුවීම ගැන එහි කරුණු දැක්වේ.

දශක තුනට ආසන්න කාලයක් මෙරට පැවති සිවිල් යුද්ධය හින්දු ආගමික ඇදහිලි හා විශ්වාස නැවත ආවර්ජනය කිරීමට ඉඩකඩ විවර කළ අවස්ථාවෙකි. යුද්ධය සහ පශ්චාත් යුධ පසුබිමට අදාලව යාපනය සහ නැඟෙනහිර පළාත ආශ්‍රයෙන් නව සංස්කෘතික සහ ආගමික පිළිවෙත් පිළිබඳ විග්‍රහයක් Shanmugalingam (2002) සහ Spencer (2014) යන අය විසින් ඉදිරිපත් කර ඇත. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මණ නොවන හින්දු ආගම සහ බුද්ධාගම සමඟ එහි පවතින සම්බන්ධය ගැන මානව විද්‍යාත්මක ගවේෂණයක් de Silva (2007) විසින් ඉදිරිපත් කර තිබේ.

ශ්‍රී ලංකාවේ බෞද්ධ පූජනීය ස්ථානවල දෙවිවරුන්ගේ රූප සහ දේව ඇඳහිලි පිළිබඳ විශ්වාසය දොළොස්වන සියවසේ පොළොන්නරුව යුගය තෙක් ඈතට දිව යයි. පසුව දහහතරවන සියවසේ කෝට්ටේ, ගම්පොල සහ මහනුවර රාජධානි යුගවල මෙම දේව විශ්වාස හා ඇඳහිලි බෞද්ධ විහාරස්ථාන කේන්ද්‍ර ගතව වඩාත් ජනප්‍රිය වී තිබේ. වර්තමානයේ බොහෝ බෞද්ධ විහාරස්ථානවල දක්නට ලැබෙන විෂ්ණු දෙවියන් බෝධිසත්වයන් ලෙස හඳුනාගනු ලබන ලබ්ධීන් සිංහලයන් අතර බහුලව දැකිය හැකිය (Halt 2006).

දෙවි දේවතාවුන් පිළිබඳ විශ්වාස වලදී දේවතාවියන් පිළිබඳ ඇඳහිලි දේවතාවුන්ගේ ඇඳහිලි වලට වඩා ජනප්‍රිය වීම ගැන කරුණු දක්වන ගණනාත් ඔබේසේකර පත්තිනි එක් අතෙකින් දමිළ වු ද අනෙක් අතින් සිංහල වු ද ලෙස අකාර දෙකකින් සමන්විත වු එකම දේවතාවියක් බව පවසයි (Obeyesekere 1988).

මෙරට සිංහල බෞද්ධයින් විසින් දේව සංකල්ප පිළිගනු ලැබීම කෙරෙහි ඉන්දු ආර්යයන් බලපෑ බැව් සඳහන් ය (Adikaram 1952,

Obeyesekere 1984, ධර්මදාස සහ තුන්දෙණිය 1994). ලංකාවේ දේව විශ්වාස තුළ දෙවිවරු රාශියක් සිටින බව එම සමාජ මානව විද්‍යාත්මක කරුණු වලින් අනාවරණය වේ. හතර වරම් දෙවිවරු, දෙවොල් හත්කට්ටුව, බණ්ඩාර හැටහත් කට්ටුව, දොළහ දෙවිවරු යන සංකල්ප සඳහන් කර තිබේ (Obeyesekere 1984).

ආගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ සමාජ මානව විද්‍යාත්මක හැදෑරීම් බලන විට ශ්‍රී ලංකා සමාජයේ සමාජ සහජීවනය ගොඩනැගීමට මෙන්ම බිඳවැටීමට ආගමේ මැදිහත්වීම ගැන කරුණු ප්‍රකාශ වේ. බෞද්ධාගම මෙරට රාජ්‍ය සන්දර්භය තුළ පිළිගත් එකකි. රාජ්‍ය නායකයා බෞද්ධයෙකු විය යුතුය යන දේශපාලන භාවිතයෙන් එය මැනවින් පිළිබිඹු කරවයි. බහු සංස්කෘතික සමාජ පසුබිමක මෙන්ම දිගු කාලීන සිවිල් යුධ ගැටුමකින් අනතුරුව පවා මෙරට සමාජය තුළ හින්දුන් සහ බෞද්ධාගමිකයන් අතර සමීප සම්බන්ධතාව ගොඩනැඟීම සලකන විට හින්දු ආගමෙන් ඉටුවන කාර්ය භාරය සැලකිය යුතු එකකි.

මෙරට බෞද්ධාගම හා සසඳන විට හින්දු ආගම තවමත් දේශපාලනීකරණයට හසු නොවීම හින්දු ආගමේ කාර්ය භාරය නොවෙනස්ව පැවතීමට හේතුවන බව සැලකිය යුතුය. බෞද්ධාගම පිළිපැදීමේ වැදගත්කම පැහැදිලි කර දෙමින් එහි මඟ පෙන්වන්වීම භික්ෂූන් වහන්සේලා විසින් සිදු කරති. ශ්‍රී ලංකාවේ බහුතර ජනයා සිංහලයින් ය. බෞද්ධාගම මොවුන්ගෙන් වැඩිදෙනා අඳහන ආගමයි. මෙය අවිහිංසාවාදී ආගමකි. කෙනෙකුගේ සංසාර චක්‍රයේ අවසානය වූ ‘නිවන’ ළගාකර ගැනීමේ වැදගත්කම හා එහි ක්‍රමවේදය මෙයින් උගන්වා තිබේ. (Gombrich 1971). මේ අරමුණ සාධනයට සංඝ සංස්ථාවේ භික්ෂූන්ගේ දායකත්වය ඉතා වැදගත් වුවකි. මෙයින් සමාජය සාමකාමී වීමට ඉඩකඩ විවරව ඇත. බෞද්ධයින් ලෝකෝත්තර පරමාර්ථ ඇතිව ක්‍රියා කිරීමෙන් සමාජයේ අර්බුද අඩු වේ යැයි ඕනෑම

කෙනෙකුට සිතෙන හා සිතිය හැකි කරුණක් බව සදහන් ය. (Tambiah 1992).

වර්තමාන ශ්‍රී ලාංකික සමාජයේ භික්ෂුවගේ කාර්ය භාරය නොයෙක් අවස්ථාවල විවාදයට යොමුවී ඇත. මිනිසුන්ගේ සාමකාමී දිවිපෙවත සුරක්ෂිත කිරීමට භික්ෂුන්ගේ අවවාද, උපදෙස් හා මඟ පෙන්වීම ඉතා වැදගත් දෙයකි. එහෙත් ලාංකික සමාජයේ ගැටුම් තීව්‍ර කිරීමට ආගමික ක්‍රියාකාරීන්ගේ බලපෑම ගැන විවිධ සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයන වලදී අවධානය යොමුකර ඇත. ඒවායින් හෙළිවන්නේ සිංහල බෞද්ධ ජාතිවාදය ප්‍රධාන පර්යේෂණ මාතෘකාවක් වී ඇති අන්දමයි. භික්ෂුන් දේශපාලනයට පිවිසීම, වෘත්තිමය නිලතල දැරීම, සිංහල ජාතික අනන්‍යතාව ඉස්මතු කෙරෙන ව්‍යාපාර මෙහෙයවීම හා එහි නායකත්වය දැරීම වැනි හේතු නිසා භික්ෂුන් ආගමික වගකීමෙන් බැහැරව ඇතැයි පෙන්වා දී තිබේ (Tambiah 1992, Senevirathne 2002). එබැවින් මෙරට හින්දු ආගමික පූජකයන් තවමත් ප්‍රසිද්ධ දේශපාලන ක්‍රියාකාරීත්වයට නොපිවිසීම එක් අතෙකින් එම පූජකයන් අතර ද, අනෙක් අතින් සමාජය තුළ ද යහපත් සංහිඳියාව සදහා පසුබිම සකස් කර තිබේ.

**මුන්නේශ්වරම මහා දේවාලය සහ පෙරහැර මංගල්‍යය**

මුන්නේශ්වරම් යනු වයඹ පළාතේ හලාවත නගරයට සැතපුමක් පමණ නැගෙනහිරින් පිහිටි විශාල කුඹුරු තැනිතලාවකින් වෙන් වූ රට අභ්‍යන්තරයේ පිහිටි කුඩා ගම්මානයකි. කළුගල් හා වැලිගල් සහිත මහත් වූ කුට්ටි වලින් ඉදිකරන ලද හින්දු දේවාලය ඉතා පෞරාණික ස්ථානයක් වන අතර එය මුන්නේශ්වරම හින්දු දේවාලය ලෙස හැඳින්වේ. මුන්නේශ්වරම දේවාලය හඳුන්වන සම්පූර්ණ නම ‘වඩිවම්බිගා සමේත

මුන්න නාථස්වාමි' (Vadivambiga Sametha Munna Nathaswamy) යන්න වේ. ශ්‍රී ලංකාවේ අනෙකුත් හින්දු දේවාල වලට වඩා පෞරාණික සම්ප්‍රදායක් මුන්නේශ්වරම් දේවාලයට තිබෙන අතර සියවස් ගණනාවක් පුරාවට හින්දු භක්තිකයන් විසින් මෙය පැරණි සිද්ධස්ථානයක් ලෙස පිළිගනු ලැබේ (Sarma 2007).

දේවානම්පියතිස්ස රජ දවස 'සාල' ග්‍රාමයේ සාල බමුණා විසින් මෙම ප්‍රදේශයේ මූලසෝ නමින් ඉදි කළ මුල් ම බෞද්ධ ආරාමය වර්තමාන මුන්නස්සරම භූමියේ තිබූ නිසා මුල්ම ආශ්‍රමය යන අර්ථයෙන් මුන්නස්සරම වී තිබෙයි. හින්දුන්ගේ මතය වන්නේ මුලින් ඇති වූ ඊශ්වර දේවාලය යන අර්ථයෙන් මුන්නේස්සරම ඇති වූ බවයි. ඒ අනුව 'මුන්නෙයි' යනු පළමුවෙනි යන අර්ථයයි. ඊශ්වර යනු දෙවියන් ය. මුන්නෙයි + ඊශ්වර මුන්නේස්සරම වී තිබෙන බව ඔවුන් දක්වයි (සුමේධ හිමි 2020: 287).

මුන්නේශ්වරම මහා පෙරහැර ශ්‍රී ලංකාවේ හින්දු කෝවිල් ආශ්‍රිතව පැවැත්වෙන ප්‍රධාන වාර්ෂික උත්සවයකි. පෙරහැර පැවැත්වීමේ චාරිත්‍රය බෞද්ධ ජන සමාජයේ ප්‍රධානතම සංස්කෘතික උත්සවයක් සේ ම එක්තරා ආකාරයක සංස්කෘතික මංගල්‍යයකි. ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ චීන වන්දනාකරුවෙකු වූ ෆාහියන් භික්ෂුවගේ ගමන් විස්තරයෙහි සඳහන් වන අන්දමට රජු විසින් සාදන ලද අනුරාධපුර දළදා මැදුරේ සිට දළදා වහන්සේ පෙරහැරින් අභයගිරි විහාරය වෙත වැඩමවා තිබේ. පසුව පුරාදින අසූවක කාලයක් ඉමහත් ගෞරව පූර්වකව දළදා වහන්සේ ප්‍රදර්ශනය කර තිබේ (වජිර හිමි 2008). මේ අන්දමට මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ වාර්ෂික ඇසළ පෙරහැර මෙන්ම වෙසක්, පොසොන්, පොහොය දින කේන්ද්‍ර කොට පෙරහැර උත්සව සේම මෙරට ප්‍රාදේශීය බෞද්ධ විහාරස්ථාන වූ කොළඹ ගංගාරාම විහාරය, මහියංගන විහාරය,

බෙල්ලන්විල විහාරය, අභයගිරි විහාරය තැන් හී වාර්ෂික පෙරහැර උත්සව පැවැත්වේ. දේව ඇඳහිලි වලට අදාල පෙරහැර සලකන විට කතරගම, මාවනැල්ල-අලුත්නුවර, මාතර-දෙවිනුවර, යාපනය-නල්ලූර්, මාතලේ-මුත්තුමාරි සහ හලාවත-මුන්නේශ්වරම යනාදිය ප්‍රධාන වේ.

වාර්ෂික මුන්නේශ්වරම පෙරහැර උත්සවය දේවාල දින දර්ශනයේ වැදගත් අංගයක් වන අතර එය හින්දු, බෞද්ධ, කතෝලිකයන් සහ මුස්ලිම්වරුන් පවා ආකර්ශණය කරයි. 1830 දශකය දක්වා මෙම උත්සවය දින 18ක් දක්වා පැවති නමුත් 1960 ගණන්වල සිට එය අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දින 28ක් පවතී. උත්සවය ආරම්භ වන්නේ දේවාලයේ කොඩිය එසවීමෙනි. මෙයින් පසු දින 13ක් පුරා ශිව කෝවිලේ පිටත මංපෙත්වල අභ්‍යන්තර විහාර පෙරහැර පවත්වනු ලැබේ. උත්සවයේ සෑම දිනකම ගනේෂා, ස්කන්ධ සහ අධිපති දේවතාවියගේ රූප විහාරය වටා ගමන් කරනු ලැබේ. වාර්ෂික මහා මංගල්‍යයට සමගාමීව ගම් තුළ පිහිටි ප්‍රාදේශීය දේවාලවල උත්සව පවත්වයි. මහා දේවලයේ ඉඩම් වල පදිංචි ගම්වාසීන් විසින් දින 28 ක් පුරාවට පැවැත්වෙන පෙරහැරේ එක් එක් දිනයේ දායකත්වය දරනු ලබයි.

මුන්නේශ්වරම මහා පෙරහැර විශේෂයෙන් අවධානයට ලක්විය යුතු කාරණයක් වන්නේ මෙම පෙරහැර දමිළ හින්දූන් හා සිංහල බෞද්ධ බැතිමතුන් යා කරන ආගමික උත්සවයක් ලෙස සැලකිය හැකි නිසාය. ඊට අමතරව මහා දේවාලෙන් පෙරහැර පැවැත්වීම සහ ඊට මිනිසුන් දායක වීම මඟින් දෙපාර්ශවයේ (1.මහා දේවාලය 2. දේවාල ඉඩම්වල පදිංචිකරුවෝ) සම්බන්ධතාව අලුතින් නැවතත් බල ගැන්වේ. මෙම කෝවිල් බිමෙහි ගණ දෙවියන්, අයියනායක දෙවියන් හා කාලි මෑණියන් වෙනුවෙන් කැප කළ දේවාල තුනක් සහ බෞද්ධ විහාරයක් ද වේ. කෝට්ටේ රාජධානියට අයත් ව පැවති සමයේ දී කෝවිල අවට වූ

ගම්මාන විශාල සංඛ්‍යාවක් ගම්වර වශයෙන් මෙම ශිව කෝවිලට ලබා දී ඇත. අතීතයේ සිටම දේවාලයේ නඩත්තුව සඳහා උපකාර කළ සිංහල, දමිළ මිනිසුන්ට පදිංචිය සඳහා මෙම ගම්වර වෙන්කර දී තිබේ.

මුන්නේශ්වරම කෝවිලේ නඩත්තු කටයුතු නිසි පරිදි කරගෙන යාමට විවිධ කුලවල අයත් මිනිසුන් ඉන්දියාවෙන් රැගෙන විත් තිබේ. ඒ බව "කෝවිලේ නිත්‍ය නෛමිත්තික කාර්යයන් මනාසේ පවත්වාගෙන එනු පිණිස කටයුතු භාරදී ඇති පූජකයන් හැර තවත් අවශ්‍ය පණිවිඩ කාර්යයන් සපුරාලීම සඳහා චෝළ දේශයට ගොස් මදුරෙයි තොණ්ඩමණ්ඩලම්, කාරෙයික්කාල්, තිරුච්චිරාජප්පල්ලි, කුඩලූර් සහ මරුංගුරු ආදි ගම් නියම් ගම් වලින් නානාවිධ කර්මාන්ත කරන අය තෝරා කැඳවාගෙන අවුත් වාසය පිණිස ගම්වර දී ඉන්නට සලස්වා ඔවුනොවුන් විසින් කළයුතු රාජකාරිය ද නියමකොට නීති පනවා ජල පහසුකම් ඇති හොඳින් වී පැසෙන කුඹුරු කැමැති පත් ප්‍රධානය කොට එම රජතුමා අධික ශිව භක්ති ශ්‍රද්ධාවෙන් යුක්තව යෙහෙන් විසීය" යනුවෙන් මුන්නේශ්වරම් වර්ණනාවෙහි දැක්වේ. ඒ වන විටත් දේවාලයේ වැඩ කටයුතු කරන සිංහල මිනිසුන් පදිංචි ගම්වල ඉන්දියාවෙන් රැගෙන ආ දමිළ මිනිසුන් පදිංචි කරවීම රජුගේ අණින් සිදුවූවකි. එසේ රැගෙන ආ විවිධ සේවා කුල නියෝජනය කරන පුද්ගලයින් මෙසේ ය.

**බ්‍රාහ්මණ**

**ශෛවර්** (ශිව භක්තික)

**සෙට්ටි** (හෙට්ටි)

**වේලාලර්** (ගොවියෝ)

**වීරමුට්ටි සංගමර්** (හක් පිඹින අය)

**කාතර්** (දෙවියන් වැඩමවන අය)

**කොල්ලූර්** (කම්මල් කාර)

**කන්නාර්** (පිත්තල වැඩකරු)

**තට්ටාර්** (රන්කරු)

**සිට්පර්** (ශිල්පීහු)

**තච්චර්** (වඩුවෝ)

**යාල්පාඩි** (වෙණ වයන්නෝ)

**එන්නෙයි වාණියර්** (තෙල් කරු)

**අගම්පඩියර්** (ආගම් පඬිවරු)

**මුල්ලෙයි මඩල්පලියර්** (මුරුතැන් කාරයෝ)

**සංගු මඩප්පලියර්** (කෑම පිසින්නෝ)

**සරුඟු මඩප්පලියර්** (වත්තල් බඩු සපයන්නෝ)

**කෙයික්කෝලර්** (පේශ කාරයෝ)

**සේණියර්** (නූල් කටින්නෝ හෝ රෙදි කර්මාන්තය කරන අය)

**ඉලෙයි වාණියර්** (කොළ සපයන්නෝ)

**විරකු වෙට්ටි** (දර කපන්නෝ)

**දූතර්** (දූතයෝ)

**නාපිතර්** (නාපිතයෝ)

**වන්නාර්** (රජකයෝ)

**තිමිලර්** (ඔරුකාරයෝ)

**වලෙඥාර්** (දැල් කාරයෝ)

**වරුණ කුලත්තාර්** (වරුණ කුල ඇත්තෝ)

**කුයවර්** (කුඹල්කාරයෝ)

**මරවර්** (මුරකාරයෝ)

**පල්ලර්** (පල්ලරයෝ)

**සානාර්** (ගස් යන්නෝ)

**කත්තික් කාරර්** (කැතිකාරයෝ)

**පරෙයර්** (බෙරකාරයෝ)

(Somaskanda Kurakkal 2016: 05).

මේ අන්දමට රැගෙන ආ මිනිසුන් හින්දු වර්ණාශ්‍රම ක්‍රමය එනම් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර යන අංශයේ කවරකට හෝ අයත් වීමකට වඩා මෙම අය ‘ජාති’ යනුවෙන් හඳුන්වන සමාජ බේදීමට ඇතුළත් වන බව පැහැදිලි වේ. හින්දු සමාජයේ සංවිධානය ගැන සලකන විට වඩා වැදගත් වන්නේ ‘ජාති’යනුවෙන් හඳුන්වන සමාජ බේදීමයි. ‘ජාති’ යන්නෙන් හඳුන්වන්නේ වර්ණ ක්‍රමයට අනුකූල නමුත් ඊට වඩා සූක්ෂම වූ සමාජ බේදීමකි. ඉන්දියාවේ ප්‍රදේශයෙන් ප්‍රදේශයට ජාති වශයෙන් ඇති බේදීම වෙනස් වේ. ශ්‍රී නිවාස් නමැති සමාජ විද්‍යාඥයාට අනුව ඉන්දියාවේ එක් ප්‍රාදේශීය භාෂාවක් කතා කරන ජන කොටසක් තුළ සාමාන්‍යයෙන් ජාති 2000ක් පමණ පවතී (Srinivas 1952, 1962). එම නිසා ඉන්දියාවේ ඒ ඒ ප්‍රදේශයේ කුල ක්‍රමයන්හි දී ක්‍රියාත්මක සමාජ ඒකකය ලෙස පවතින්නේ ජාති ඒකකයන් ය.

සාමාන්‍යයෙන් එක ගමක් තුළ එක ජාතියක සිට ජාති විස්සක් පමණ දක්වා සිටින්නට පුළුවන. ගමක් තුළ වැඩි වශයෙන් වෙසෙන්නේ කුමන කුලයට (ජාතියට) අයත් අය ද යන්න ගමෙන් ගමට වෙනස් වෙයි ( සිල්වා 1997: 23).

ඒ අනුව මුන්නේශ්වරම මහා දේවාලයේ රාජකාරිය සඳහා ඉන්දියාවෙන් රැගෙන ආ අය එක් එක් ජාති නියෝජනය කරන අය වේ. ඒ බව ඔවුනොවුන්ට අවේණික වු වෘත්තීන් වලින් තහවුරු වෙයි. මහා දේවාලයේ වැඩ කටයුතු කරගෙන යාම එක් සේවා කොටසක් සපයන අයට පමණක් සිදුකළ නොහැකි දෙයක් වු බැවින් විවිධ සේවා නියෝජනයක් මෙහි දක්නට ලැබේ. ඒ අනුව මහා දේවාල මහා පෙරහැරේ දායකත්ව රටාව විවිධ කුල (ජාති) එකතුවෙන් සම්මිශ්‍රණය වු පද්ධතියක් ලෙස ගොඩනැඟී තිබේ. කුල ක්‍රමය හා සම්බන්ධ සමාජ සංවිධානය මඟින් එක් පැත්තකින් කුලය තුළ සමීප සහ සමානාත්මතාවය මුල්කොට ගත් අන්තර් පුද්ගල සබඳතා තහවුරු වු අතර, අනෙක් පැත්තෙන් කුල අතර ධුරාවලි ලක්‍ෂණ සහිත නැතහොත් අසමානත්වය (උස්මිටිකම) විවෘතව ප්‍රකාශ වන සබඳතා බිහිවී ඇත. සමාජ සංවිධානය පිළිබඳ මෙම කරුණු අතින් හින්දු සහ සිංහල කුල ක්‍රම අතර මූලික සමානත්වයක් පවතී (සිල්වා 1997: 40).

මුන්නේශ්වරම් කෝවිලේ රාජකාරිය හා සම්බන්ධ විවිධ කුලවලට අයිති මිනිසුන් පදිංචි ව සිටින ගම, වෘත්තිය සහ සමාජ සම්බන්ධතාව ඔවුන් අයිති කුලය අනුව වෙනස් වේ. එබැවින් හලාවත ප්‍රදේශයේ තිබෙන කිසියම් ගමක (සිතියම් සටහන 01) නම පැවසු විටෙක එම ගම කවර කුලයට අයත් ද යන්න පිළිබඳව එහි බොහෝ වැසියෝ දනිති. එබැවින් කුලය හා බැඳුණු රාජකාරිය මඟින් මිනිසුන් බෙදා වෙන්

කොට තිබෙන්නා සේ ම හලාවත ප්‍රදේශයේ පිහිටි ගම් වැඩි ප්‍රමාණයක් වර්ග කොට හඳුනා ගැනීමට කුල සාධකය ඉවහල් වී තිබේ.

මුන්නේශ්වරම මහා දේවාලයට අයිති ගම්වර හී පදිංචි මිනිසුන් විවිධ කුල (ජාති) නියෝජනය කරන අතර එක ගමක එක් කුලයකට අයිති මිනිස්සු පමණක් පදිංචිව සිටිති. පෘතුගීසි යුගය වන විට දේවාලයට අයත් ගම් 64 සිට 106 දක්වා වැඩි විය. අද දක්වාම දේවාලයට අයත් රාජකාරි ඉටු කරන ගම් ලෙස මරදන්කුලම, මනක්කුලම, කාක්කපල්ලිය, සියඹලාගස්වැව, පම්බල, පොන්නම්කන්නිය, පහළගම, කරවිට, ඉනිගොඩවෙල, තිරප්පන්කුලම, කීරියන් කල්ලිය, අක්කර වෙල්ලිය, කරුකුපනේ, මුන්දලම, සූරුවිල, ගල්මුරුව, තිත්තකඩේ, මාදම්පේ, බංගදෙනිය, උඩප්පුව, ඉලිප්පන්දෙනිය, මයියාව සහ වීරපඬියාන (හේව්සි ගසන අය පදිංචි ගම්මානය) ආදි ගම්මාන දැකගත හැකිය (ඩේවිඩ් 2012: 160).

## මහා දේවාලය හා පෙරහැර මංගල්‍යය සමඟ බැඳුණු රාජකාරිය සහ එහි නව ප්‍රවණතා

මුන්නේශ්වරම මහා දේවාල පෙරහැර උත්සවයේ රාජකාරිය[3] ලෙස පවරා තිබෙන කටයුතු කිරීමට පැමිණි ස්ත්‍රී පුරුෂ බේදයෙන් තොරව සිංහල- දමිළ වැඩිහිටියන් සමඟ සාකච්ඡාවෙන් ලබාගත් තොරතුරු මෙම කොටසින් විශ්ලේෂණය කෙරේ. සෑම දමිළ කෙනෙකුට ම හොඳින් සිංහල භාෂාව කතා කිරීමට හැකිවීම විශේෂ ලක්ෂණයක් විය.

[3] රාජකාරිය යන්නෙන් තෙ වැදෑරුම් සේවයක් අදහස් කරන ලද බව පෙනේ. එනම්
1. ‘කත් හාල්’ - රාජකාරිය යනුවෙන් රජතුමාට ගෙවිය යුතු බද්ද.
2. යුද්ධ අවස්ථා වලදී හා ජාතික හදිසි අවස්ථා වලදී ඉටු කළ යුතු විශේෂ පෞද්ගලික රාජකාරිය.
3. ඉඩම් භුක්තිය සලකාගෙන රජතුමාට මුදලින් හෝ ද්‍රව්‍යයෙකින් හෝ ගෙවන බද්ද ද යනුවෙනි (බලන්න පීරිස්, 2005).

ජනවාර්ගිකත්වය, කුලය, ස්ත්‍රී පුරුෂ බව, වයස හෝ වෘත්තිමය ස්වභාවය වැනි සමාජ විෂමතා සාධක පෙරහැර උත්සවයට අදාල රාජකාරිය ඉටු කිරීමට බල නොපෑවකි. චාරිත්‍රානුකූලව පෙරහැරේ රාජකාරිය ඉටු කිරීම යන සංසිද්ධිය සමඟ බැඳුණු ප්‍රධාන කාරණා දෙකකි. පළමුවැන්න කවර ආකාරයෙන් හෝ සැලකිල්ලට ගන්නා සමාජ විෂමතා (කුලය, ස්ත්‍රී පුරුෂ බව, ජනවාර්ගිකත්වය, පන්තිය වැනි) වලින් බැහැර වෙමින් පොදුවේ පෙරහැර මංගල්‍යයට ජනතාවගේ දායකත්වය ලබා දීම ය. දෙවැන්න මහා දේවාලයට අයිති ඉඩම්වල පදිංචිය වෙනුවෙන් සිය රාජකාරිය පැහැර නොහැරීමට මිනිසුන් වග බලා ගැනීම ය.

මුන්නේශ්වරම් දේවාල පෙරහැර හැම වසරක ම අගෝස්තු හා සැත්තැම්බර් මාස දෙක ඇතුළත් ව දින 28 ක් පවත්වනු ලැබේ. මාසයකට ආසන්න කාලයක් පැවැත්වෙන පෙරහැර මංගල්‍යයේ වැඩ කටයුතු වල වගකීම දේවාල ගම්වලට පවරා තිබේ. තමන්ගේ ගමට අදාල දිනයේ ගමේ ප්‍රධානීන් ඇතුළු ගම් වැසියෝ පූජා භාණ්ඩ ද රැගෙන දේවාලය කරා පැමිණ පෙරහැරට සහභාගි වෙති. ගමට වෙන්කර ඇති දිනයේ එහි ගම්වැසියන් විසින් පෙරහැර සිදු කිරීමේ වගකීම බාර ගන්නා අතර එය පරම්පරා ගත රාජකාරියක් වු බැවින් එය නිසි ලෙස ඉටු කරන්නට ගම් වැසියෝ යුහුසුළු වූහ.

එක් එක් දිනට අදාළ ගම නම් කරමින් මහා දේවාල පෙරහැර දැන්වීම් පත්‍රිකාව සෑම වර්ෂයකම මුද්‍රණය කෙරේ. 2022 පෙරහැර ට අදාල දැන්වීම් පත්‍රිකාවේ සඳහන් 28 දිනයේ එනම් 2022 වර්ෂයේ සැත්තැම්බර් 10වන සෙනසුරාදා දහවල් දිය කැපීමේ චාරිත්‍රයෙන් සමාන්‍යයෙන් පෙරහැර අවසන් විය යුතු වුවත් දිය කැපීමෙන් අනතුරුව ද එනම් සැත්තැම්බර් 12, 13, 14, 15 යන දින වල පෙරහැර පැවැත්වෙන බව සඳහන් වේ (බලන්න ඇමුණුම-1, පිටුව 311). සාමාන්‍යයෙන් මෙරට

පැවැත්වෙන ඕනෑම ආගමික පෙරහැරක දිය කැපීමේ අවස්ථාවෙන් පසුව එම පෙරහැරේ නිමාව සිදුවන බව සනිටුහන් කරන නමුත් වර්තමානයේ මුන්නේශ්වරම මහා දේවාල පෙරහැර එසේ නොවන බව සම්මුඛ සාකච්ඡාවකින් පැහැදිලි විය.

*''සල්ලි තියෙන අයටත් එයාලගේ කියලා පෙරහැරවල් කරන්ට ඕනෑ වුනා.... දිය කැපුවට පස්සේ දි පෙරහැර බාර අරගෙන කරන්නේ ඒ අය... එතැනදිත් පෙරහැරේ චාරිත්‍ර කෙරෙනවා.... වෙනසක් නෑ.... කලින් පෙරහැරවල් වලට වගේ මෙච්චට රාජකාරියක් ගැවෙන් නෑ.... මේ පෙරහැර ඉවර වුනාට පස්සේ දිය කැපීමක් නෑ..... ඉස්සර නං මෙච්චා දකින්ට තිබ්බේ නෑ.. දැන් තමයි මේ....''*
(සම්මුඛ සාකච්ඡාව අංක 04)

ඒ අනුව වර්තමානයේ මුන්නේශ්වරම මහා දේවාල පෙරහැර කාර්යයන් කුලය හා බැඳුණු රාජකාරිය ක්‍රමය ට පමණක් සීමා නොවී ආර්ථිකය හා බැඳුණු පන්ති ක්‍රමය ද ඊට එකතු වී තිබේ. ඉහත සම්මුඛ සාකච්ඡාවෙන් ප්‍රකාශ වන පරිදි මුදල් වියදම් කිරීම හරහා පෙරහැර පැවැත්වීමට අලුතෙන් අවස්ථා විවර කරගෙන ඇත. 2022 පෙරහැර පැවැත්වීමට නව ඉඩ ප්‍රස්ථා ලැබුවන් අතර ඡායාරූප ආයතන හිමිකරුවන්, රත්තරන් වෙළඳ ව්‍යාපාරික ආයතන හිමිකරුවන් හා කොළඹ නාගරික ව්‍යාපාරිකයන් සිටී. නව පෙරහැර අවස්ථා සම්බන්ධයෙන් ජනවාර්ගික වෙනස බල නොපෑවකි. විශේෂයෙන් ම වසර තිහකට ආසන්න කාලයක් සිවිල් යුධ පසුබිමක් පැවති සමාජයක ජනවාර්ගිකමය අනවබෝධය හා විරසකය බැහැර කිරීමට මුන්නේශ්වරම මහා පෙරහැරෙන් පෙන්නුම් කෙරෙන ජනවාර්ගික සහයෝගය ඉතා වැදගත් එකකි. මේ තත්ත්වය විශේෂයෙන් ම දිගු කාලීන යුධ ගැටුමෙන් පීඩා විඳි මෙවැනි සමාජයකට බෙහෙවින් වැදගත් වේ. කෙසේ නමුත් නව පෙරහැර අවස්ථා මඟින් ජනවාර්ගික සහජීවනය ගොඩනැඟීම සිදුවුවද ඊට වඩා පන්ති ක්‍රමයෙන් සමාන පුද්ගලයන් අතර සම්බන්ධතාව

ශක්තිමත් කර තිබේ. එබැවින් ජනවාර්ගික භේදයෙන් තොරව ඉහළ පන්ති නියෝජනය කරන්නන්ගේ එකතු වීම මෙහිදී සිදුවී තිබේ.

මුන්නේශ්වරම මහා පෙරහැර උත්සවය දිය කැපීමෙන් අනතුරුව අවසන් වූ පසු ද පෞද්ගලිකව මුදල් වියදම් කිරීම මඟින් නව පෙරහැර වාර පැවැත්වීමේ ඉඩකඩ විවරව තිබේ. පුද්ගලයා සතු ආර්ථික හැකියාව මඟින් ආගමික චාරිත්‍ර වැඩියෙන් කිරීමේ ඉඩ ප්‍රස්තා ඇතිවීම දැකිය හැකිය. මෙහිදී වැටහෙන සාමාන්‍ය කාරණයක් වන්නේ දෙවියන් කෙරෙහි භක්තිවන්ත වු දිළින්දෙකුට එවැනි අවස්ථා නොලැබෙන බව ය. මුදල් ඕනෑම සමාජයක ප්‍රමුඛ සාධකය වන්නා සේම හුවමාරු මාධ්‍යයේ සියල්ල මුදල් මත පදනම් වීමේ ස්වභාවය සැලකිය යුතු දෙයකි. ශ්‍රී ලංකා සමාජයේ මුදල් ප්‍රමුඛත්වයට රැගෙන ආ ආර්ථික ව්‍යුහය ගොඩනැංවීම ට යටත් විජිතවාදයෙන් ඉහළ බලපෑමක් ඇති කෙරිණි. යටත් විජිත වාදයෙන් පසුව ශ්‍රී ලංකාව ඇතුළුව ආසියාතික කලාපයේ සම්ප්‍රදායික නිෂ්පාදන ක්‍රමයන් වෙනුවට ධනවාදී නිෂ්පාදන ක්‍රමය ආදේශ වීම සැලකීමේ දී විදේශිකයන් විසින් හඳුන්වා දුන් වතු බෝග වගාව ප්‍රධාන වේ (De Silva 1982).

බ්‍රිතාන්‍යයන් විසින් 1833 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හරහා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම මෙරට කුලය හා බැඳුණු ආර්ථික පද්ධතිය බිඳ වැටීමට හේතුවිය. අනෙක් අතට ශ්‍රමයට මුල්‍යමය වටිනාකමක් ගෙන දෙන මුදල් ආර්ථිකය ශක්තිමත් වීම ද කාරණයකි. යටත් විජිතයෙන් පසුව මෙරට මුදල් ආර්ථිකය ක්‍රමානුකූලව වර්ධනය වුවත් ඊට සමගාමීව සංස්කෘතියේ වෙනස් කම් ඇති නොවුන බව ඉහත සම්මුඛ සාකච්ඡාවෙන් පෙනෙයි. එහි පවසා ඇත්තේ ‘ඉස්සර නං මෙච්චා දකින්ට තිබ්බේ නෑ.. දැන් තමයි මේ...’ යනුවෙනි. ඒ අනුව අතීතයේ පටන් පැවැත එන මුන්නේශ්වරම මහා දේවාල පෙරහැර දිය කැපීමෙන් අවසන් වුවද නව පෙරහැර වාර ඉදිරි දවස් කිහිපයකට කරගෙන යාමට

ධනවත් පුද්ගලයන්ගේ මැදිහත් වීම හේතු විය. මෙය මුන්නේශ්වරම් පෙරහැරේ දැකිය හැකි නව ප්‍රවණතාවකි. කෙසේ වුවත් පෙරහැර තුළ අන්තර්ගත චාරිත්‍රානුකූල ආගමික වතාවත් නව පෙරහැරේ පැවති බව ඉහත සම්මුඛ සාකච්ඡාවෙන් පැවසේ. සමාජයේ බොහෝ දේවල් මුදල් මත වෙනස් වුවද සම්ප්‍රදායික ආගමික චාරිත්‍රයන් හි අන්තර්ගතය එසේ වෙනස් නොවුන බැව් පෙනේ.

වාර්ෂිකව පැවැත්වෙන මුන්නේශ්වරම මහා දේවාල නිකිණි මහා පෙරහැර මංගල්‍යයේ කප් සිටුවීමේ දිනයේ සිට මාසයක කාලයක් පවත්වනු ලබන පෙරහැර සටහන මෙසේය.

01 කප් සිටුවීම - මරදන්කුලම පෙරහැර

02 වන දින පෙරහැර - දේවාලය ඇතුලේ පෙරහැර

03 වන දින පෙරහැර - අඹගහ වීදිය පෙරහැර

04 වන දින පෙරහැර - අඹගහ වීදිය පෙරහැර

05 වන දින පෙරහැර - අඹගහ වීදිය පෙරහැර

06 වන දින පෙරහැර - මරදන්කුලම ආරච්චියාර් පෙරහැර

07 වන දින පෙරහැර - මනක්කුලම පෙරහැර

08 වන දින පෙරහැර - කාක්කපල්ලිය සහ සේමායිරුප්පුව පෙරහැර

09 වන දින පෙරහැර - සියඹලගස්වෙල සහ පම්බල පෙරහැර

10 වන දින පෙරහැර - පොන්නාංකන්නිය සහ පහලගම පෙරහැර

11 වන දින පෙරහැර - කරවිට පෙරහැර

12 වන දින පෙරහැර - ඉනිගොඩවෙල පෙරහැර

13 වන දින පෙරහැර - මුන්නේශ්වරම පෙරහැර

14 වන දින පෙරහැර - පීරප්පන්කුලිය සහ පහලගම පෙරහැර

15 වන දින පෙරහැර - කීරියන්කල්ලිය අක්කරවෙලි හින්දු ගම් වැසියන්ගේ පෙරහැර

16 වන දින පෙරහැර - ශ්‍රී ලංකා හින්දු මලයාල මහජන සභාවේ පෙරහැර

17 වන දින පෙරහැර - කුසල කරුකුපනේ සහ කොට්ටගෙෙ පෙරහැර

18 වන දින පෙරහැර - මුන්දලම පෙරහැර

19 වන දින පෙරහැර - සුරුවිල පෙරහැර

20 වන දින පෙරහැර - ගල්මුරුව පෙරහැර සවස ගණ දෙවි පෙරහැර

21 වන දින පෙරහැර - තිත්තකඩේ ගමේ සහ මයිලයියා නාඩාර් පෙරහැර සවස කතරගම දෙවි පෙරහැර

22 වන දින පෙරහැර - මරදන්කුලම පෙරහැර සවස මහා විෂ්ණු පෙරහැර

23 වන දින පෙරහැර - සවස ගිණි පෑගීම උත්සවය සහ රාත්‍රී 63 බැතිමතුන්ගේ පෙරහැර

24 වන දින පෙරහැර - සවස භික්ෂාඩන උත්සවය. රාත්‍රී මරදන්කුලම ආරච්චියාර් සහ උඩප්පු අම්බලකාර පෙරහැර

25 වන දින පෙරහැර - සවස නඩේසර් උත්සවය

26 වන දින පෙරහැර - සවස අඹ විදින උත්සවය. රාත්‍රී උඩප්පු ගම්වැසියන්ගේ පෙරහැර

27 වන දින පෙරහැර - දවල් මහා රථෝත්සවය. රාත්‍රී තිමිල ආඩියප්පු ගමරාල මහතා සහ අඩප්පු රාමලංගම් මහතාගේ පෙරහැර

28 වන දින පරහැර - දහවල් දිය කැපීම. උත්සවය රාත්‍රී හලාවත හින්දු තරුණ සභාවේ පෙරහැර

(ක්ෂේත්‍ර අධ්‍යයන තොරතුරු, 2022 අගෝස්තු).

2022 මුන්නේශ්වරම මහා දේවාල පෙරහැර විස්තරය පත්‍රිකාව අනුව 2022 අගෝස්තු මස 14 වන දින කප් සිටුවීමෙන් ආරම්භ වන පෙරහැර දවස් 28 ක් ගෙවෙන සැත්තැම්බර් 10 සෙනසුරාදා දහවල් දිය කැපීමේ උත්සවයෙන් අවසන් වන නමුත් එහි නව පෙරහැර නැවත පහත දැක්වෙන පරිදි හඳුනා ගත හැකිය.

සැත්තැම්බර් 12 සඳුදා - උදේ කිරිකල උත්සවය

අනුග්‍රහය - හලාවත ලක්ෂමී ස්ටුඩියෝ

සැත්තැම්බර් 13 අඟහහරුවාදා -රාත්‍රී සන්ඩේස්වරර් උත්සවය

අනුග්‍රහය- නිව් නදියා ජුවලරි මාර්ට්

සැත්තැම්බර් 14 බදාදා- උදේ ප්‍රායචින්න පූජාව

අනුග්‍රහය- කොළඹ නන්දන විදුරුවන් මහතාගේ උත්සවය

සැත්තැම්බර් 15 බ්‍රහස්පතින්දා- රාත්‍රී භෛරව පූජාව

අනුග්‍රහය- මීගමුව බ්‍රහ්ම ශ්‍රී ආර්. ජෙගීස්වර සර්මාගේ උත්සවය

කලින් සදහන් කළ පරිදි දින 28ක් තිස්සේ පැවැත්වෙන පෙරහැරේ ප්‍රධාන දායකත්වය මහා දේවාලයෙන් ඉඩම් ලැබූ ගම්

වැසියන්ගේ මුලිකත්වයෙන් සිදුකරන එකකි. මහා දේවාලයට වුවමනා සේවය වෙනුවෙන් ඉඩම් ලැබු මිනිසුන් පහත් කුල (ජාති) වලට අයත් වේ. මුන්නේශ්වරම් වර්ණනාවෙන් පෙන්වා දී තිබෙන පරිදි මෙම අය මල් සැපයීම, පිරිසිදු කිරීම, බෙර වාදනය යනාදි වශයෙන් වු පහළ යැයි සම්මත සේවාවන් හී නිරතව සිටිති. කුල ධූරාවලියේ පහළ ස්තරය නියෝජනය කරන්නන් සමාජයේ පහළ යැයි පිළිගත් කාර්යයන් සිදුකරන බව තව දුරටත් මෙයින් පැහැදිලි වේ. අනෙක් අතට මුන්නේශ්වරම මහා දේවාලයේ ආගමික සහ පරිපාලන සේවා කටයුතු බ්‍රාහ්මණ කුලයේ අය විසින් සිදු කරනු ලබයි. හින්දු කුල (ජාති) බේදීම අනුව බමුණන් පවිත්‍ර හින්දු ගණයට ඇතුළත් වන අතර ඊට විවිධ උප කුල අයත් වේ (සිල්වා 1997). දෙවියන් හා සම්බන්ධ කටයුතු උසස් කුලයේ අයට පැවරී තිබිමෙන් පවිත්‍රත්වය පිළිබඳ කාරණය අවධානයට ගෙන ඇත. ඒ අනුව මහා දේවාලයේ කාර්යයන් සහ පෙරහැර මංගල්‍යයේ සේවා සැපයීම කුල ධූරාවලියේ පවතින උසස් හා පහත් යන තත්ත්ව පිළිවෙළ සැලකිල්ලට ගනිමින් සිදුකර තිබේ.

**හේවිසි වාදනය සහ කුල සම්බන්ධතාව**

කප් සිටුවීමේ සිට දිය කැපීම දක්වා දින 28ක කාලයක් පැවැත්වෙන මුන්නේශ්වරම පෙරහැරේ දායකත්වය එක් එක් ගම ට වෙන්කර දී තිබේ. එහෙත් සමස්ත පෙරහැරේ ශබ්ද පුජාව ලෙස සැලකෙන බෙර වාදනය (හේවිසි වාදනය) වීරපඬියාන ගමෙහි (සිතියම 1 හි 570A ) ගම් වැසියන් (පරෙයර්වරුන්, නැකති කුලයේ මිනිසුන්) විසින් සිදු කෙරේ. බෙරකාරයන් වීරපණ්ඩියානේ නතර කරවා උත්සව කාලයන් හි බෙරවාදනය සහ අඬබෙර ගැසීමට ද අණ කළේ (Somaskanda Kurakkal 2016: 8) යැයි සඳහන් වේ.

වීරපඬියාන ගම් වැසියන් දේවාලයේ රාජකාරිය වෙනුවෙන් තවමත් කැපවී සිටිති. විවිධ හේතු මත සමාජය ක්‍රමයෙන් වෙනස් වුවද

දෙවියන් වෙනුවෙන් සිදුකරන රාජකාරිය නිසි පරිදි ඉටු කිරීමේ වගකීම පැහැර නොහැරීමට වග බලා ගෙන තිබේ. සිංහල කුල ක්‍රමය[4] අනුව හේවිසි වාදන රැකියාව අයත් වන්නේ නැකති කුලයට යි. සම්ප්‍රදායිකව පැවත එන බෙරවාදන වෘත්තියේ නියැළීම මඟින් කුල අනන්‍යතාව ආරක්ෂා වේ (සිල්වා 1997). කුලය හා බැඳුණු සෙසු වෘත්තීන්ට වඩා බෙර වාදනයට නව පරම්පරාවේ අය වැඩි නැඹුරුවක් දක්වන අයුරු සම්මුඛ සාකච්ඡා තුළින් පැහැදිලි විය. පුසාරි හෝ ප්‍රභූවරයෙකු ට (බ්‍රාහ්මණ කුලයට අයිති) පමණක් ප්‍රවේශ විය හැකි දෙවොල ආසන්නයට පහත් කුලයේ කෙනෙකු ට යාමට අවස්ථාව හිමිවන්නේ රාජකාරි සේවාව නිසා ය. දෙවියන් හා සම්බන්ධ සෑම ආගමික චාරිත්‍රය දී ම එහි විචිත්‍ර බව සඳහා බෙර වාදනය වැදගත් වේ. බෙර වාදනය අත්‍යවශ්‍ය අංගයක් බවට පත්වීම තුළ එම සේවය සපයන්න් ට තුළ කිසියම් අභිමානයක් ගෙන දී තිබෙන අන්දම පහත සම්මුඛ සාකච්ඡාවෙන් පෙනේ.

*"අපි පරම්පරාවෙන් කරගෙන එන රස්සාව මේක.... දේවාලේ වැඩ කරන එක ආඩම්බරයක්.... අපි නැතිව ඒ වැඩ ලස්සනට කරගන්ට බෑ.... දෙයියන්ගේ ඉඩම් වල අපි ජීවත් වෙන්නේ.... රාජකාරිය කරන්ට අපි දෙයින්ට බැඳිල ඉන්නේ...."* (සම්මුඛ සාකච්ඡාව අංක 03).

[4] "සිංහල කුල ක්‍රමයේ ආරම්භය කවර දා කෙසේ සිදුවී ද යන්න කාලයේ වැලි තලාවෙන් යට වී ඇත. මුල් යුගයේ ඉතිහාසඥයන් ගේ මතය වුයේ ඓතිහාසික වශයෙන් සිංහල කුල ක්‍රමය හින්දු කුල ක්‍රමයෙන් බිඳී ආ ආයතනයක් බවයි. හින්දු කුල ක්‍රමයේ මූලික ස්වභාවය බ්‍රාහ්මණ මතවාදය වෛදික දර්ශනය සහ හින්දු පූජා විධි මගින් තීරණය වුයේ යම් සේද, සිංහල කුල ක්‍රමය වර්ධනය වුයේ වැඩවසම් මූල ධර්මවලට අනුකූලව සකස් වූ සිංහල රාජ්‍යත්වය හා බැඳුණු පරිපාලන ක්‍රමයේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි ය. පාලක පන්තිය විසින් ඔවුන්ට අවශ්‍ය භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ මාධ්‍යයක් ලෙස පමණක් නොව රාජ්‍ය පරිපාලනයේ ප්‍රධාන මූල ධර්මය ලෙසත් කුල ක්‍රමය යොදාගත් බව පෙනේ." (බලන්න සිල්වා 2005).

පාරම්පරික ජීවනෝපායක් පැවතීම කුල ක්‍රමය හා බැඳුණු ප්‍රධාන ලක්ෂණයකි. පරම්පරාවෙන් රැකියාවක් උරුමවීම යන කාරණය ආර්ථික ස්ථාවරත්වයට හේතු වුවකි. අනෙක් අතට පරම්පරාවෙන් උරුම වන වෘත්තියක් පැවතීම යන කාරණය ජීවනෝපායන් පිළිබඳ අවිනිශ්චිත බව ඇති නොවීමට හේතුවකි. බෙර වාදනය කරන්නන් දමිළ ව්‍යවහාරයේ පරෙයර්වරුන් ලෙස ද සිංහල ව්‍යවහාරයේ දී නැකති හෙවත් බෙරව කුලයේ අය ලෙස ද හඳුන්වනු ලබයි. සිංහල කුල ක්‍රමයේ නැකති කුල ප්‍රමාණාත්මක වශයෙන් කුඩා වුවත් ලංකාවේ බොහෝ ප්‍රදේශවල කුඩා න්‍යෂ්ටීන් ලෙස ඒවා ව්‍යාප්තව තිබේ. නැකති හෙවත් බෙරවා කුලයට අයිති පාරම්පරික වෘත්තීය වන්නේ බෙර ගැසීම, නැටුම්, නක්ෂත්‍ර වැඩ යනාදියයි (සිල්වා 1997: 31).

පෙරහැර උත්සවය අලංකරණය කෙරෙන සුවිශේෂී අංගයක් වන්නේ බෙර වාදනයයි. සෑම පෙරහැර අවස්ථාවක ම විශේෂිත අංගයක් බවට මෙය පත්වේ. මහනුවර ඇසළ පෙරහැරේ එක් එක් හඬ රටා අනුව බෙර වාදනය කෙරෙන අතර එය මහත් අභිමානයෙන් සිදුකරනු අයුරු දැකිය හැකිය. නර්තන ශිල්පීන්ගේ නැටුම් පමණක් නොව අලි ඇතුන්ගේ ගමන් විලාශය ද බොහෝ විට බෙර වාදනයේ හඬට අනුව සිදුවනු පෙනේ. මුන්නේශ්වරම් පෙරහැර විචිත්‍රවත් වීමට සිය සේවාව නැතිවම බැරි දෙයක් ලෙස වීරපඬියානේ මිනිස්සු සිතන අන්දම සම්මුඛ සාකච්ඡාවෙන් පැහැදිලි විය. කුල ධුරාවලියේ පහල තත්ත්වයක් ගනු ලැබුව ද මොවුහු සිය සේවාව මහත් ආඩම්බරයෙන් සලකන බව පැහැදිලි ය. පහළ කුලවල සේවා සපයන්නන් සංඛ්‍යාත්මක වශයෙන් සීමාවීම නිසා එම සේවාවන් පිළිබඳව එක්තරා විධියක ඒකාධිකාරීත්වයක් (monopoly) ඇති කර ගැනීමට ඒ ඒ සේවා කුලවලට හැකිවී ඇත. මේ අනුව කුල ක්‍රමය මඟින් ධුරාවලියේ පහළ ම ස්තරවලට අයත් අය පවා සමස්ත සමාජයේ අත්‍යවශ්‍ය සහ සිටිය යුතු

(indispensable) කොටසක් බවට පත් ඇතැයි ඊ. ආර්. ලීච්ගේ අදහස පෙන්වා දෙයි (සිල්වා 1997: 42)

මුන්නේශ්වරම පෙරහැර මංගල්‍යය මාසයක කාලයක් සහ ඉන් අනතුරුව ද නව පෙරහැර දින කිහිපයක් ගමන් ගන්නා බව හඳුනා ගන්නා ලදී. මෙම හැම අවස්ථාවක ම බෙර වාදනයේ වගකීම පැවරී තිබෙනුයේ වීරපඬියාන ගම් වැසියන් ට ය. කෙසේ නමුත් වීරපඬියානේ ගම් වැසියන්ට අමතරව වෙනත් පිරිසක් ද බෙර වාදනය සිදුකරන බව සම්මුඛ සාකච්ඡා 9න් හෙළිවිය. වීරපඬියානේ ගම් වැසියන් අඛණ්ඩව දින ගණනක් බෙර වාදනය කිරීම, නිදි වැරීම හා වෙහෙස වීම ආදිය නිසා බෙර වාදනය කිරීම පිටස්තර අය වෙතට පත්ව තිබේ. අනෙක් අතට පාරම්පරිකව සිය වෘත්තිය කරගෙන යාමට තරමේ ළමයින් ගණනක් පවුලේ නොසිටීම එසේම අධ්‍යාපනය, වැටුප් ලබන රැකියා නියුක්තිය, විදේශ රැකියාවලට යාම සහ පවුලේ කාර්ය බහුලත්වය ආදි කරුණු නිසා බෙර වාදනය කුලයෙන් බැහැර අය වෙත යොමුවී තිබෙන බව සම්මුඛ සාකච්ඡාව 1න් හෙළිවිය.

*''දැන් සමාජෙ වෙනස්... පවුල් වල ළමයි අඩුයි... ඉන්න අයත් ඉගෙන ගෙන මොනවහරි කරනවා.. ගොවිතැන් කරනවා.. නැත්තං රට රස්සා හොයාගෙන යනවා.. කසාද බැඳලා පිට වෙලා යනවා.. හේවිසි වැඩේ විතරක් නෙවෙයි.. දේවාලේ අනික් වැඩ කියලත් පිට අය කරනවා.. ඒ ඒ වැඩ දන්න තරුණ ළමයින් වගයක් මහා දේවාලේ වැඩ වලට ඉන්නවා.. ඒ ගොල්ලෝ එක එක ගම්වල තරුණ කට්ටිය.. එකතුවෙලා වැඩක් කරනවා.. වෙලාවකට සල්ලිත් ගන්නවා.. පඩියට නෙවෙයි දවසේ වියදම් වලට කියලා ගන්නේ...''*
(සම්මුඛ සාකච්ඡාව අංක 01)

සමාජය වෙනස්වීම[5] මුන්නේශ්වරම දේවාලයේ රාජකාරි ක්‍රමයේ කිසියම් වෙනසක් ඇතිවීමට බලපා තිබේ. හලාවත ප්‍රදේශය තරමක් නාගරීකරණය වු එකක් වන අතර අවට මිනිසුන් නිරතුරුව හලාවත නගරය හා සම්බන්ධ වේ. මෙහි ගම් වැසියෝ නගරයට සම්බන්ධ කෙරෙන අතරමැදි පාලමක් ලෙසට ද මුන්නේශ්වරම් මහා දේවාලය සැලකිය හැකියි. දේවාල පෙරහැර පැවැත්වෙන මාසයක පමණ කාලයක් අවට ගම් වැසියෝ දේවාලය සමඟ ඍජුව සම්බන්ධ වෙති. දේවාලය අර්ධ නාගරික තැනෙක පිහිටි එකක් වුවද එය නාගරීකරණය වූ එකක් සේ සැලකිය හැක්කේ නාගරීකරණය වූ ප්‍රදේශවල ජනයා සහ විදෙස් සංචාරකයින්ගේ පැමිණීම මෙහි නිරන්තරයෙන් සිදුවන බැවිනි. මේ නිසා නාගරික සමාජයේ ඇති ගති ලක්ෂණ මුන්නේශ්වරම දේවාල අවට ගම් වැසියන් තුළින් බෙහෙවින් දැකගත හැකිය. එසේම වර්තමානයේ ඇති තරඟකාරී ජන මාධ්‍යය සහ සමාජ මාධ්‍යය මඟින් ග්‍රාමීය ජනයා පුළුල් සමාජයට ඉතා ඉක්මනින් සම්බන්ධ වීමට බලපා තිබේ. පාසල් අධ්‍යාපනය සඳහා නවීන තාක්ෂණ භාවිතය (කොවිඩ් වසංගතය වැනි ව්‍යසන හේතුවෙන්) හඳුන්වා දීමෙන් පාසල් ළමුන් අතර ජංගම දුරකථන හා පරිඝණක භාවිතය ව්‍යාප්තිය සමඟ ඔවුන් විශ්ව සමාජයට ඉතා ඉක්මනින් අවතීර්ණ වෙමින් සිටී.

මේ සියලු තත්ත්වයන් සෙසු පළාත් වල සේම හලාවත ප්‍රදේශයේ සම්ප්‍රදායික ජන ජීවිතය වෙනස් කිරීමට හේතු වුවකි. පවුල් සංස්ථාවේ හැකිළීම, ඉහළ අධ්‍යාපන අවස්ථා, දෙස් විදෙස් රැකියා, නව්‍ය වාසික විවාහ ආදිය මඟින් සිදුවන සමාජ චල්‍යතාව වැනි කරුණු නිසා

[5] සමාජ වෙනස් වීම යන්න වසර කිහිපයකට පෙර ඔවුන් හෝ ඔවුන්ගේ දෙමව්පියන් නිරත ක්‍රියාකාරකම්වලට වඩා වෙනස් වූ ක්‍රියාකාරකම්වල නිරත වීම හා එසේ නිරත පුද්ගලයන් ප්‍රමාණයේ වෙනසක් ඇති වීමයි (බලන්න Merrill 1952).

මුන්නේශ්වරම මහා දේවාල පෙරහැරේ රාජකාරි සේවාව ඉටු කිරීමේ ස්වරූපය වෙනස් වී තිබේ. වර්තමානයේ මහා දේවාල ඉඩම්වල පදිංචි සමහර පවුල් රාජකාරිය ඉටු කරනු වෙනුවට ඊට හිලව් මුදල් ගෙවන බව හඳුනා ගත හැකි විය. සම්මුඛ සාකච්ඡා 5න් පවසා සිටියේ ‘දැන් නං ගොඩක් අය දේවාලෙට සල්ලි ගෙවල තමන්ගේ වැඩ කොටස වෙන කට්ටියකගෙන් කරවා ගන්ට කියනවා....’ යන්නයි. මෙහිදි කුලය හා බැඳි රාජකාරි සේවාව පැහැර හැරීමක් සිදුනොවන අතර එය වෙනත් පාර්ශවයක් වෙත පැවරීම සිදුකොට තිබේ. මෙය වර්තමාන මුන්නේශ්වරම මහා පෙරහැර ට අදාල රාජකාරී ක්‍රමයේ දැකිය හැකි නව ප්‍රවණතාවකි. කුල ධුරාවලියේ පහළ මට්ටම්වල අයගේ ආර්ථික ශක්තිය හා අධ්‍යාපන මට්ටම යනාදිය ඉහළ යන අවස්ථාවල දී (උඩුකරු චලනතාව) ඔවුහු කුල ධුරාවලිය මුළුමනින් ම ප්‍රතික්ෂේප කරනවා වෙනුවට කුල ධුරාවලිය තුළ තමන්ගේ සාමුහික තත්ත්වය ඉහළ නංවා ගැනීමට ඇතැම් විට උත්සහ කරන බව පෙන්වා දී තිබේ (සිල්වා 1997).

**කප් සිටුවීම හා පරිපාලනය**

පළමු දිනයේ මුන්නේශ්වරම මහා දේවාල පෙරහැරේ කප්[6] සිටුවීම සිදු කෙරෙන අතර එමඟින් පෙරහැර උත්සවයේ ආරම්භය සනිටුහන් කෙරේ. කප් සිටුවීමේ කාර්යය ශිව දෙවියන් ප්‍රධාන කොට ගත් දේවාලයේ ආගමික වතාවත් බ්‍රාහ්මණ කුල වංශිකයන්ට පැවරී ඇති වගකීමකි. ඒ අනුව මහා දේවාලයේ පරිපාලන කටයුතු වලට අමතරව පුද පුජා පැවැත්වීමේ කටයුතු බ්‍රාහ්මණ කුලයේ අයට පැවරී තිබෙන සේවාවක් බව පැහැදිලි වෙයි. එනම් බ්‍රාහ්මණ වංශිකයන් සතු සේවාවන්

[6] ‘කප’ යනු විශේෂයෙන් පිලියෙළ කරගත් දැව කණුවකි (බලන්න පීරිස් 2005: 129).

නොවෙනස් ව පවතින බවයි. හින්දු කුල ධුරාවලියේ ඉහළින් ම සිටින බ්‍රාහ්මණයින්ගේ රාජකාරිය වන්නේ පූජකයන් ලෙස වැඩ කටයුතු කිරීම ය (සිල්වා 1997: 24). මුන්නේශ්වරම මහා දේවාලයේ වන්දනය කෙරෙන ශිව දෙවියන් සහ පත්තිනි මෑණියන් හෙවත් ප්‍රතිමාම්බිකා දේවිය මුල්කොට ගත් සියළු ආගමික වතාවත් බ්‍රාහ්මණ පූජකවරුන්ට හිමිවී තිබේ. ඒ බව "සොළී රටින් තම ගුරුදේව වූ නීලකණ්ඨ ශීලාචාර්ය වරයන් ද ඔහුගේ ධර්ම පත්තිනිය වූ විශාලාක්ෂි අම්මාල් සහිත වූ පුත්‍රවරුන් ද, වේදාන්ත ශිවාගම කලාඥාන දන්නා බ්‍රාහ්මණයන් ද කැඳවා ශුභ මොහොතින් කුම්භාභිෂේක කරවා පසුව නිත්‍ය නෛමිත්තික කාර්යයන් මනාසේ පවත්වාගෙන එනු පිණිස කටයුතු පූජකයන් වෙත බාර දුන්හ" (Somaskanda Kurakkal 2016: 6) යන උධෘතයෙන් හෙළිවේ.

මුන්නේශ්වරම මහා දේවාලයේ පරිපාලන කටයුතු බ්‍රාහ්මණ කුලයේ අයට පැවරුන රාජකාරියන් බැව් මුන්නේශ්වරම වර්ණනාවේ දැක්වේ. එහි සදහන් ආකාරයට "මෙසේ වසන සමයෙහි පූජකවරුන් විසින් පවත්වාගෙන එනු ලබන පූජාවිධි නිසි පරිද්දෙන් පවත්වා ගෙන යනු පිණිස මෙම ස්ථානයට ස්ථිර පාලකයෙකු අවශ්‍ය බව වැටහී ගියෙන් මධුරා පුරයට ගොස් චන්ද්‍රකුල තිලක වූ තනියුන්තාප් සුපාල නම් නීති දත් උත්තම සුගුණොත්තුංග මහ රඳුන් කැඳවාගෙන අවුත් මුන්නේශ්වරම් නඟරයෙහි රාජ්‍ය අනුශාසනා කරන සේ ඔටුණු පළඳවා අභිෂෙස් කළේය" යනුවෙන් දැක්වේ. මෙහි සදහන් ආකාරයට දේවාල පරිපාලනය සඳහා කුලයෙන් උසස් වීම පමණක් නොව දැන උගත්කම හා යහපත් මානව ගුණාංග වලින් හෙබි අයෙකු වීමේ කාරණය සැලකිල්ලට ගෙන තිබේ. මෙවැනි පරිපාලන රටාවක් පැවතීම විනිවිඳ භාවය, මැදහත් බව, අර්බුද කළමණාකරණය මෙන්ම ආයතනික

දියුණුවට ඉවහල් වේ. මේ පසුබිම මුන්නේශ්වරම මහා දේවාලයේ ස්ථාවරත්වය හා ප්‍රගතිය කෙරෙහි බලපෑ කාරණයක් බව පැහැදිලි වෙයි.

වර්තමානයේ විවිධ හේතු නිසා මිනිසුන්ගේ ජන ජීවිතයේ වෙනස්කම් සිදුවනු පෙනේ. එය කාර්මීකරණය, නාගරීකරණය, වානිජකරණය, බටහිරකරණය හෝ ගෝලීයකරණය වැනි කවරකගේ හෝ බලපෑම නිසා සිදුවිය හැකිය. එසේ වුවත් මිනිසුන් විශ්වාස තබන සහ අදහන ආගමික පිළිගැනීම් වල වෙනසක් සිදුනොවන අන්දම මුන්නේශ්වරම් මහා දේවාලයේ රාජකාරි සේවාවන් එලෙසම පවත්වාගෙන යාමට මිනිසුන් ක්‍රියා කිරීමෙන් පැහැදිලි වෙයි. විශේෂයෙන්ම දේවාලය හා සම්බන්ධ රාජකාරිය ඉටු කිරීමේ ස්වභාවයේ යම් යම් නව ප්‍රවණතා දැකිය හැකි වුවද එම වගකීම නියමිත පරිදි ඉටු කිරීමට එහි ජනයා නිරතුරුව පෙනී සිටීම දකින්නට පුළුවන. රාජකාරිය පැහැර නොහැරීමට විවිධ කරුණු හේතුවන්නට පුළුවන. සමහර විට ඔවුන් භුක්ති විඳින ඉඩමේ අයිතිය අහිමි වේය යන සැක සංකාව ඊට හේතුවක් වන්නට පුළුවන. යම් කිසි ඉඩමක් භුක්ති විඳින තැනැත්තෙක් ඒ ඉඩම උදෙසා වූ නියමිත රාජකාරිය ඉටු කිරීමට නොහැකි හෝ අකමැති හෝ වී නම් ඒ ඉඩම වෙනත් කෙනෙකුට පැවරීමට සමහර අවස්ථා වලදී ඉඩ තිබිණි. රාජකාරිය පැහැර හැරීම නිසා උල්පැන් ගෙයි සේවයෙහි නියුක්තව සිටි ශට්ටම්බි කෙනෙකු මුලින් භුක්ති විඳි ඉඩම් පංගුවක් ඉඩම ඉල්ලා සිටි වෙනත් තැනැත්තෙකුට රාජාධි රාජසිංහ රජතුමා පවරා දෙනු ලැබී යැයි සඳහන් වේ (පීරිස් 2005: 92).

### සැරසිලි හා අලංකරණය කිරීම

මුන්නේශ්වරම මහා දේවාලය වටේ පෙරහැර තෙදිනක් පැවැත් වේ. මෙය පුරාණයේ සිට අඹගහ වීදිය පෙරහැර නමින් හඳුන්වන බවත් එකල පෙරහැර ගමන් ගන්නා මඟ දෙපස අඹ ගස් බහුලව තිබෙන්නට

ඇති බැවින් එනමින් පෙරහැර හඳුන්වා ඇතැයි සිතිය හැකි බවත් සම්මුඛ සාකච්ඡා 2න් පෙන්වා දුන්නේය. පෙරහැරේ ආරම්භක මුල් දිනයන් මහා දේවාලය හා අවට ප්‍රදේශය මෙන්ම පෙරහැරේ කටයුතු උත්සවශ්‍රීය ගන්නා බැවින් එහිදී සැරසිලි කාර්යයට ප්‍රධාන තැනක් හිමිවෙයි. මෙම සැරසිලි වලට වුවමනා මල්, ගොක්කොළ, පළතුරු සහ ලී දඬු යනාදිය නියමිත පරිදි සපුරාලීමේ රාජකාරිය ඉටු කිරීමට ගම් කිහිපයක් වෙන්කර තිබේ.

*''පෙරහැරේ වැඩට කාටත් සහභාගි වෙන්ට පුළුවන්... බාධාවක් නෑ... ඒ වුනාට රජකාලේ ඉඳං දේවාලෙන් ගම් බිම් වෙන් කරල දීල තියෙන්නේ... රාජකාරි වැඩ කරන්ට... ඒ කාලේ රාජසිංහ රජ්ජුරුවෝ තමයි ඉඩං දීල වැඩ පවරල තියෙන්නේ... ඒ වැඩේ හරි විධියට කරන්ට ඕනෑ... දැන් කාලේ සමහරුන් නං කාලේ හැටියට සල්ලි දීලා ඔය වැඩවලින් ගැළවෙනවා...''* (සම්මුඛ සාකච්ඡාව අංක 02).

රාජසිංහ රජු විසින් දේවාලය සතු ඉඩම් මිනිසුන්ට ප්‍රදානය කොට එහි පදිංචි කරවුයේ මහා දේවාලයේ නියමිත වැඩ කටයුතු කරවා ගැනීමට ය. එබැවින් රාජකාරිය අනුව මහා දේවාලය නඩත්තුව හා එය පවත්වාගෙන යාම මෙහි ගම් වැසියන් සතු වගකීමක් විය. එමෙන්ම වාර්ෂික පෙරහැර උත්සවයට ගම් වැසියන්ගේ පොදු දායකත්වය හා සහභාගිත්වය ලබා දිය යුතු විය. මසකට ආසන්න කාලයක් පැවැත්වෙන පෙරහැරට එක් එක් ගම්වල දායකත්වය ලබා දීම අනිවාර්ය දෙයකි. ඉහත සම්මුඛ සාකච්ඡාවෙන් පවසා ඇත්තේ පෙරහැර කාර්යයන්ට ඕනෑම කෙනෙකුට සහභාගි විය හැකි බවයි. එයින් අදහස් වන්නේ යමෙක් කරනු ලබන සේවය හුදෙක් පුද්ගලයෙකු අරභයා සිදුකරන එකක් නොව එය දෙවියන් වෙනුවෙන් සිදුකරන එකක් වන බවයි. දෙවියන් සම්බන්ධව වැඩ කිරීමේ දී සීමා නොපවතින අතර කවර හෝ කාර්යයක්

සිදුකළ හැකිය. එසේ වුවත් රාජකාරියෙන් පවරා තිබෙන නියමිත කාර්යය සිදු කිරීමට මුල්තැන දිය යුතු බව කියැවෙයි.

මහා දේවාලයේ වැඩ කටයුතු කිරීමට ගම් ප්‍රදේශ වෙන්කර දීම රජුගේ නියමයෙන් සිදුවුවකි. මෙහිදී රජු විසින් අණ කරනු ලැබූ වැඩ කොටස ඉටු කිරීම රාජකාරිය වූ බව අධ්‍යයනයේ සම්මුඛ සාකච්ඡා 8න් ප්‍රකාශ විය. එබැවින් මෙම සෑම ගමක් ම මුන්නේශ්වරම මහා දේවාලයට කළ යුතු රාජකාරිය නොඅඩුව සිදුකළ යුතු විය. වර්තමානයේ රාජකාරිය ඉටු කිරීමේ යම් යම් වෙනස්කම් ඇතිවී තිබෙන බව අධ්‍යයන තොරතුරු වලින් දැනටමත් හෙළිවිය. කෙසේ නමුත් මහා දේවාලයේ වැඩ සඳහා නම් කර තිබෙන ගම් සහ ඊට අයිති රාජකාරිය පැහැදිලිව හඳුනාගත හැකිය.

"චන්ද්‍රවංශාභිජාත තනියුණ්ණා භූපාල මහරජු ද, කුලක්කෝට්ටු මහරජුගේ අණ පරිදි මුන්නේශ්වරම් දේවාලයට අයිති ඉඩකඩම් ගම් හැට හතරකට බෙදා ඒවාට තනිතනිව නම් තබා ශුද්ධ වේලාලු වංශිකයන්ගෙන් ආ **අගම්පඩි වෙල්ලාලයන්**ගෙන් දොළොස් දෙනෙකු තෝරා ඔවුන්ගෙන් පළමු තැනැත්තාට '**චන්ද්‍රශේඛර මුදලිප් පට්ටම් කට්ටි**' යයි ද, දෙවැන්නා ට '**පට්ටම් කට්ටි කෝරාල** ' යයි ද, සෙස්වුන්ට '**අතුකෝරාල**' යයි ද නම්බු නාම දී ඔවුන්ගෙන් පළමු දෙදෙනාට මුන්නේශ්වරම් හී පදිංචි වනසේ නියම කොට ගබඩා ආදි වැඩ ඔවුනට භාරදී ඇතුල් ප්‍රාකාරයෙහි සහ බිහි ප්‍රාකාරයෙහි දෙවියන් වැඩමවීම පිණිස ඔවුන්ගේ පරපුරෙන් පැවැත එන අය විසින් කළ යුතු යැයි අණ කළේය. අනෙක් දස දෙනා පම්බල , පහල බ්‍රාහ්මණ දළුව, කොකාවිල, කඹගල යන ගම්වල ද, මායානදියෙන් එතෙර සුරුවෙල, පල්ලම, දෙගඹව, මණ්ඩලාන, මනික්කුලම, උහම්පිටිය යන ගම්වල වාසය කරන සේ නියම කොට එම ගම් වලින් කෝවිලට අයවිය යුතු දහයෙන් දෙකක් ආදායම් බැලීම,

ගොවිතැන් කරවීම, උත්සව කාලවල දී අවශ්‍ය වන ලී දඬු, සහල්, වී, පළතුරු වර්ග, ගොක්කොළ ආදිය සැපයීම සඳහා ගම්වැසියන්ට උපදෙස් දිම සහ ඔවුනට නියමිත දේවාල සේවාවන් කරවීම ද නියම කළහ" (Somaskanda Kurakkal 2016: 7) යනුවෙන් සඳහන් කර තිබේ.

**මහා දේවාලය සමඟ බැඳුණු සෙසු කාර්යයන්**

මහා දේවාලයේ වැඩ සඳහා අගම්පඩියර් හා වේලාලර් කුලවලට අයිති මිනිස්සු ගම් කිහිපයක පදිංචිව සිටිති. මොවුන් ආගමික සේවාවලට අදාල සහ ගොවිතැන් වැඩ කටයුතුවලට සම්බන්ධ වු පිරිසකි. මුල් කාලයේ මහා දේවාලයේ වැඩ කටයුතුවලට සේ ම පෙරහැර උත්සවයේ කාර්යයන්ට මොවුන්ගේ දායකත්වය වැදගත් තැනක් ගෙන තිබේ. **අගම්පඩියර්, වේලාලර්** වංශිකයන් ගෙන් කිහිප දෙනෙකු එලිවිට, කාක්කපල්ලිය, මානාවර්, කරවිට, ගණන්කැටේ, ඉහළ බ්‍රාහ්මණ දළුව, මුගුණුවටවන, විලත්තව, මණ්ඩලාන, වීරකොම්බන්දළුව, වීරරප්පන්කුලිය, ඔලිදළුව, මරුදම්කුලම, තිත්තකඩේ යන ගම්වල පදිංචි වන සේ නියම කොට විශේෂ උත්සව කාලවලදී මල් වර්ග, අඹකොළ, පොල්මල් යනාදිය සැපයීම දෙවියන් වැඩමවීම, හක් පිඹීම, වී කෙටීම, පහන් තට්ටු මුට්ටු මැදීම, පහන් පත්තු කිරීම, සේවක ජන පාලනය, හඳුන් ඇඹරීම, කෝවිල ඇතුල පිට ඇමදීම, ගොම ගෑම, රථ ඇදීම, තොරන් බැඳීම යනාදිය කිරීම පිණිස ඔවුන්ට නියම කළේය (Somaskanda Kurakkal 2016: 7).

වර්තමානයේ අගම්පඩියර් හා වේලාලර් කුලවලට අයිති මිනිසුන් ට පැවරී තිබෙන දේවාල රාජකාරියේ වැඩවල යම් කාර්ය කොටස් ඔවුන් විසින් සිදුනොකරන බව හෙළි විය. විශේෂයෙන් ම කෝවිල ඇතුළත හා පිටත අතුගෑමේ කටයුතු, වී කෙටීම, පහන් තට්ටු පිරිසිදු කිරීම, හඳුන්

ඇඹරීම වැනි කාර්යයන් සිදුනොකොට ඒ සඳහා මුදල් ගෙවන බැව් පැහැදිලි විය.

*"ආගමේ වැඩ, ගොවිතැන් වැඩ නං දැනුත් කරනවා... ඒ වුනාට ගොම ගාන, වී කොටන, හඳුන් අඹරන වගේ එව්වා නං දැන් කරන් නෑ... එව්වාට හිලව්වට මහා කෝවිලට සල්ලි බඳිනවා... රාජකාරි වැඩ අපේ අතින් නොකරන එකට හේතු එකක් කියලා නෑ..."* (සම්මුඛ සාකච්ඡාව අංක 06).

මහා දේවාලය වෙනුවෙන් ඉටු කළයුතු රාජකාරිය නොසළකා හැරීමක් සිදුනොවී එය වෙනත් ස්වරූපයකින් සිදුකරන අයුරු ඉහත සම්මුඛ සාකච්ඡාවෙන් ප්‍රකාශ වේ. දේවාලයට මුදල් ලබාදීම මගින් තමන් විසින් සිදුකළ යුතු වැඩ කොටස වෙනත් කෙනෙකුගෙන් කරවා ගැනීමට අවස්ථාව සලස්වා තිබේ. සිය පදිංචියට ඉඩම් ලැබීම වෙනුවෙන් දෙවියන්ට රාජකාරිය ඉටු නොකොට ඒ වෙනුවට මුදල් ලබාදීම කලින් හඳුනාගත් පරිදි මෙම අවස්ථාවේ ද දකින්නට තිබේ. ඒ අනුව තමන් විසින් කළ යුතු රාජකාරිය වෙනකෙකු ලවා සිදු කිරීම හෙවත් අන් අයෙකුට විතැන් කිරීම මඟින් විවිධ බිඳ වැටීම් ඇතිවිය හැකිය. මෙයින් ඉඩම් ලාභියා හා දේවාලය අතර ඇති බැඳීම දුර්වල විය හැකිය. තමන් විසින් ම රාජකාරිය ඉටු නොකිරීම නිසා දෙවියන් පිළිබඳ ඇති භක්තිය දුර්වල කළ හැකිය. එසේම ආගමික පරිසරයෙන් දුරස් වීමෙන් පුද්ගලයා තුළ ආගමික ශික්ෂණය අඩු වීමට මෙන්ම සමාන කුලයේ අය අතර සාමූහිකත්වය දුර්වල කිරීමට මෙය හේතු විය හැකිය. එවගේම සියල්ල මුදල් මඟින් සිදුකළ හැකිය යන ආකල්පය ඇතිකළ පුද්ගල සිත් තුළ ජනිත කළ හැකිය.

වර්තමානයේ මුන්නේශ්වරම මහා දේවාලය හා බැඳුණු රාජකාරිය විතැන් කරවීමට විවිධ හේතු බලපා තිබෙන බව ඉහත සම්මුඛ සාකච්ඡා කිහියකින් ම පෙණුනි. ඉහත සම්මුඛ සාකච්ඡා 6න්

හෙළිවන්නේ වී කෙටීම, හඳුන් ඇඹරීම වැනි කාර්යයන් සඳහා නව උපකරණ භාවිතය වඩා පහසු වී තිබෙන බවයි. එසේම තොරණ් බැඳීම වැනි කටයුතු දින ගණනක් කළ යුතු බැවින් වැඩි කාලයක් ඊට යෙදවිය යුතුය. එබැවින් කාලය ඉතිරි කර ගැනීමේ අරමුණින් මුදල් ලබා දී අදාල කාර්යයෙන් නිදහස් වී තිබේ. එමෙන් ම පිරිසිදු කිරීම වැනි වැඩ වලදී කුල අනන්‍යතාව අන් අයට පෙනෙන බැවින් ඊට ඇති අකමැත්ත මුදල් ලබා දීමට බලපා තිබේ. පවුලේ අධ්‍යාපනය ලැබූවන් හා රැකියා කරන්නන්ගේ අකමැත්ත එවැනි රාජකාරි වැඩ වලින් වැළකී සිටීමට හේතුවක් විය. ඒ අනුව දේවාලය හා බැඳි රාජකාරිය ඉටු කිරීමේ ක්‍රමයේ වෙනසක් දැකිය හැකි නමුත් දේවාලයට ආගමික හා රාජකාරිමය වශයෙන් ඇති බැඳීමේ අඩුවක් සිදුනොවී තිබෙන බව පැහැදිලි වුවකි.

ශ්‍රී ලංකාවේ වෙනත් හින්දු දේවාල වලට වඩා මුන්නේශ්වරම මහා දේවාලයේ රාජකාරිය ඉටු කිරීම පිණිස දමිළ හා සිංහල ජනයාගේ සමීප සම්බන්ධතාව කිසිදු භේදයෙන් තොරව පැවතීම අධ්‍යයනයෙන් පෙණුනි. රජු විසින් මහා දේවාලය අවට පිහිටි ඉඩම් සියල්ල ම පාහේ මහා දේවාලය යටතට ගෙන ඒවායේ විවිධ කුල නියෝජනය කරන මිනිසුන්ට ලබා දී ඒ සමඟම දේවාලයේ නඩත්තු රාජකාරිය වෙන් වෙන්ව දක්වා තිබේ. ඒ අනුව මුන්නේශ්වරම මහා දේවාලයේ වැඩ කටයුතු නිසි ලෙස පවත්වා ගෙන යාම ඒ ඒ කුලවලට අයත් මිනිසුන්ට පැවරුණු රාජකාරියකි. එසේම වගකීමකි. මහා දේවාලයේ රාජකාරී වෙනුවෙන් නම් කර තිබූ ගම් කිහිපයක් දැනටමත් හඳුනා ගන්නා ලදී. පහතින් දැක්වෙන්නේ ගම් 49ක ප්‍රමාණයකට වෙන් වෙන්ව පවරා තිබෙන රාජකාරී කටයුතු ය.

"**වීරමුට්ටි බණ්ඩාරවරුන්** මුන්නේශ්වරමේ බණ්ඩාරිය මුල්ල ස්ථානයෙහි වසන සේ සලස්වා කෝවිලෙහි නිත්‍ය පූජා පාත්‍ර ශුද්ධ කිරීම,

ධූප දීප නැංවීම, මල්ගෙන ඒම, තේවාරම් කිරුවාසගම් සජ්ඣායනය කිරීමට ද, **ශිල්පාචාරීන්** මුන්නේශ්වරමෙන් දකුණු දිග්භාගයෙහි වසනසේ සලස්වා දේවාලයෙහි ඇති පලුදු හරිගැස්සීමට ද, **කම්මල් කාරයන්** කරවිටත්, බංගදෙනියේත් වසන සේ සලස්වා රථ වාහන ආදියට අවශ්‍ය යකඩ කර්මාන්තාදී අදීර්වෙඩික්කට්ටි, තීවර්ති, ආයක්කාල්, කැති, පොරෝ, උදලු ආදි උපකරණ සාදන ලෙස ද, **වඩුවන්** බංගදෙනියේ වසන සේ සලස්වා දේවාලයට අවශ්‍ය ලී කර්මාන්ත, රථ වාහානාදිය ද සාදවා දෙන ලෙස ද, **කන්නාරයන්** පාලාකුලමේත් හලාවතත් නවත්වා පූජා පාත්‍ර විලක්කු ආදියෙහි පලුදු හරිගස්සා දෙන ලෙස ද, **වේලාකාරයන් සහ දේවදාසීන්** මුන්නේශ්වරමේත් හලාවතත් නතර කරවා පිරිමින් ට දේවාලයෙහි තූර්ය වාදනය පැවැත්වීමට ද, දේවදාසීනට නැටුම් පැවැත්වීමට සහ ආලත්ති වැඩීමට ද, **කුඹලුන්** වඩකාලමුල්ලේ ද, මුන්නේශ්වරමෙහි ද නතර කරවා අවශ්‍ය ගඩොල්, උළු, මැටිවළන් යනාදිය ඇති තාක් සපයා දෙන ලෙස ද, **හුණුවාණියර්වරුන්** මරවෙල ගමේ නවත්වා උත්සව කාලවලට අවශ්‍ය මණ්ඩපාදියෙහි හුණු පිරියම් කිරීමට ද, දේවකාර්යයන්ට අවශ්‍ය හුණු සපයා දීමට ද, **පේශාකාරයන්** මුන්නේශ්වරමේ ද, හලාවත ද නවත්වා උත්සවයන්ට කොඩි, රෙදි, නූල්, ලනු ද ප්‍රධාන කුරුක්කල් වරුන්ට අවශ්‍ය ඇඳුම්, උතුරු සළු, කුම්භ වස්ත්‍ර සහ ඩිංගිරි ඇදුම් යනාදිය වියා දෙන ලෙස ද, **පොරෝකාරයන්** පහළගම පොන්නගනේ යන ගම්වල නතර කරවා මී, දොඹ, තල, එරඬු, පොල් ආදියෙන් තෙල් සිඳ දීමටත් දර කපා දීමටත් ද, **තිමිලයන්** තිම්ලේ නම් ගමේ නවත්වා මායානදියෙන් සෙනඟ එගොඩ මෙගොඩ කිරීම, රථ ඇඳීමට කඹ අඹරා දීම සහ රථ ඇදීම යන වැඩ ද, **සානාරයන්** මනක්කුලම නම් ගමේ නතර කරවා පහන්රුක් සහ ආලවට්ටම් උත්සව

කාලවලදී ඇල්ලීමට ද, තොරන් බැඳීමට ද, කුරුම්බා, දර, ඉදල්, කොහු, තාම්බුක්කයිරු, පොල් අතු , ගොක්කොල , පොල්මල් යනාදිය සපයා දෙන ලෙස ද, **කරුප්පට්ටිකාරයන්** ඉනිගොඩවෙල නතර කරවා දේව පූජාවන්ට අවශ්‍ය හකුරු, වට්ටි පෙට්ටි ආදිය සම්පාදනය කරන ලෙස ද, **යක්දුරයන්** කාක්කපල්ලිය, ඉලුප්පදෙනිය, සියඹලාගස්වෙල, කරුක්කුලිය, දිගම්වෙල යන ගම්වල නතර කරවා කෝවිලේ නිත්‍ය නෛමිත්තික තේවාවන් හි දි හක් පිඹීම පිණිස ද, **මාලාකාරයන්** මුන්නේශ්වරමේත් තිම්ලේත් පදිංචි කරවා දේව පූජාවනට අවශ්‍ය මල් ගොතා දෙන ලෙස ද, **රජකයන්** හතර කොටසට බෙදා මුගංම්දළුවේ හා සෙම්බුකට්ටියේ ද නතර කරවා දේවාලයේ පරිවෙෂ්ටණ දැමීම, පාවාඩ එලීම, පන්දම් එතීම, වියන් බැඳීම, පහන්තිර සැපයීම ද යනාදි වැඩ කරන සේ අණ කළහ" යනුවෙන් විස්තර කර තිබේ (Somaskanda Kurakkal 2016).

ඉහත කුලය සහ එයට අදාල සේවය දැක්වෙන තොරතුරු අනුව එකම කුලයට අයිති මිනිසුන් ගම් ප්‍රදේශ කිහිපයක පදිංචිව සිටින බව පැහැදිලි වෙයි. එබැවින් ඒ ඒ ගම් අතර සමීප සම්බන්ධය ගොඩනැගීම සඳහා කුල සමානත්වය පමණක් නොව දේවාලයේ රාජකාරිය කිරීමට අවස්ථාව ලැබීම ද හේතුවකි. එකම කුලයේ මිනිසුන් ගම් කිහිපයක පදිංචිව සිටීම නිසා ගම් අතර විවාහ ගණුදෙණු සිදුවී තිබේ. ඒ බව "කසාද බැඳිල්ලක් එනකොට කුලේ අවුස්සනවා... හොයනවා... බලනවා... ඔය කියන ගම්වල කසාද සිද්ධ වෙනවා හරි හරියට... ඇයි ඔක්කෝගේ ම කුලේ එකයි නේ...." යැයි සම්මුඛ සාකච්ඡා 10න් කියා සිටියේ ය. සමාන කුලයේ පවුල් අතර සම්බන්ධතාව ශක්තිමත් වීමට මෙම අන්තර් ජන්‍ය විවාහය වැදගත් වුවකි. කුල ක්‍රමය යටතේ ඇති

ප්‍රධාන සමාජ මුල ධර්මයක් නම් කුලය තුළ සිදුවන අන්තර්ජන්‍ය විවාහය යි (caste endogamy) (සිල්වා 1997: 37).

එක් එක් කුලයේ මිනිසුන් ට පවරා දී තිබෙන වැඩ බෙදා දැක්වීම අනුව මුන්නෙශ්වරම් මහා දේවාලය හා බැඳුණු රාජකාරි ක්‍රමයේ සංකීර්ණ බව දැකගත හැකිය. කුල ක්‍රමය තුළ වැඩ බෙදා වෙන් කිරීම තවමත් රාජකාරිය හා බැඳී තිබෙන දෙයක් බව පැහැදිලි වෙයි. කුල ක්‍රමය මුලික වශයෙන් පාරම්පරිකව උරුම වු ශ්‍රම විභජන ක්‍රමයක් ලෙස Leach (1960) විසින් හඳුන්වා දි තිබේ. කුල අනන්‍යතාව පවත්වා ගැනීමට ශ්‍රම විභජන රටාව ඉවහල් වන අතර එම තත්ත්වය මුන්නේශ්වරම මහා දේවාලයේ වැඩ කටයුතු සංවිධානයට සහ එම වැඩ කොටස් බෙදා වෙන් කර ගැනීමට පහසුව ගොඩනගා තිබේ. එබැවින් රාජකාරිය ඉටු කිරිමේ ස්වභාවය වෙනස් වුවත් රාජකාරිය නොපිරිහෙළා ඉටු කිරිමේ වගකීම් සහගත බව එලෙසෙම පවතින එකක් බව පැහැදිලි වෙයි.

එසේම කුල කිහිපයකට අයිති මිනිසුන් රාජකාරි ක්‍රමය මඟින් එකට ඇද බැඳ තැබීම සිදුවී ඇත. සම්මුඛ සාකච්ඡා 08න් අනාවරණය වුයේ “ගම් පනහ හැටක විතර මිනිස්සු මහා දේවාලේ වැඩ වලට ඉන්නවා.... ඒ ඔක්කොම එක එක කුලවල කට්ටිය... මහා දේවාලේ වැඩ වලදි කුල මල අයින් කරල දාලා දෙයියන්ගේ බාර ගත්තු වැඩ ටික කරනවා... ඇත්ත කියන්ට එපැයි.. හැබැයි ඉස්සර කෙරිච්ච වැඩ අද කරනවා කියන එක නං බොරු... අනික දැන් ගොඩක් ගම් පලාත් වෙනස් වෙලානේ තියෙන්නේ...” යනුවෙනි. කෙසේ නමුත් විවිධ කුල වලට අයිති මිනිසුන් එක් අරමුණක් (මහා දේවාලයේ රාජකාරිය ඉටු කිරීම) වෙනුවෙන් ක්‍රියා කිරීම හරහා ඔවුනොවුන් අතර කිසියම් එකඟතා හා ගණුදෙණු ඇති වීමට පසුබිම ගොඩනැගී තිබේ. පොදුවේ බලන විට සමස්ත මහා දේවාල පද්ධතියේ ම පැවැත්ම රාජකාරී ක්‍රමය මත තවමත් රඳා පවතින අයුරු දැකිය හැකිය. පීරිස් (2005) පවසන පරිදි ඉන්දියාවේ

මෙන් කුල විශාල ගණනක් තිබුනා නම් මෙවැනි ක්‍රමයක් සංවිධානය කිරීම උගහට බව ඉතාමත් පැහැදිලි ය.

ගම් ප්‍රදේශ අතර අන්තර් සහයෝගය අඛණ්ඩව පවත්වා ගැනීමට දේවාලය හා සම්බන්ධ රාජකාරිය වැදගත් විය. විවිධ කුල නියෝජනය කරන මිනිසුන් දෙවියන්ට අදාල වැඩ කටයුතු වලදී එකතු වීම අධ්‍යයනයෙන් පැහැදිලි විය. ඒ බව සම්මුඛ සාකච්ඡා 9න් පවසා සිටියේ ‘කුල ගෝත්‍ර බේද නෑ දෙයියෝ ඉදිරියේ ’ යනුවෙනි. කවර හෝ ආගමික පිළිගැනීමක් මඟින් මිනිසුන් අතර සම්බන්ධතාව ගොඩනඟන බව පැහැදිලි වෙයි. ආගම මිනිසුන් අතර ඒකාබද්ධතාව ඇතිකරන බව එමිල් ඩර්කයිම් සමාජ විද්‍යාඥයා විසින් පෙන්වා දුන්නකි. මුන්නේශ්වරම හින්දු ආගමික පුද බිමක් වුවද පෙරහැර මංගල්‍යයේ රාජකාරි සේවාව තුළ සිංහල ජනයාගේ සැලකිය යුතු නියෝජනය දැකිය හැකිය. කෙසේ වුවද මුන්නේශ්වරම මහා දේවාලය සහ එහි ඉදිරිපස තිබෙන පුරාණ බෝගස, හින්දුන් හා බෞද්ධයින් අතර සබඳතාව සනාථ කෙරේ. දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේදී අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය කිරීමේදී පැණ නැගි දෙතිස් ඵල රුහ බෝධීන් වහන්සේලාගේ එක් නමක් මෙම භූමියේ රෝපණය කළ බව ජනප්‍රවාදයේ සඳහන් වන අතර අදටත් මුන්නේශ්වරම දේවාලයට පිවිසෙන ප්‍රධාන දොරටුව ඉදිරිපිට මෙම පුරාණ බෝධීන් වහන්සේ වැඩ වෙසේ (ඩේවිඩ් 2012: 154). මුන්නේශ්වරම පුදබිම බෞද්ධකරණය කිරීමට ගත් උත්සාහයන් අසාර්ථකවීම ගැන අදහස් ඉදිරිපත් කර තිබේ (Bastin 2002).

## නිගමනය

පළමු අදියරේ දින 28ක් පුරාවට පැවැත්වෙන මුන්නේශ්වරම මහා දේවාල වාර්ෂික පෙරහැරේ ප්‍රධාන දායකත්වය උසුලනු ලබන්නේ

දේවාලයෙන් ඉඩම් ලැබ ඒවායේ පදිංචිව සිටින සේවා කුල (ජාති) වල මිනිසුන් විසිනි. මෙම මිනිස්සු දේවාලයෙන් ලබා දුන් ඉඩම් වල පදිංචි කරවීමෙන් දේවාල නඩත්තුව සහ සේවා කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට හැකි වී තිබේ. දේවාලයේ අදාල සේවා කටයුතු පැවරීම කුල ධුරාවලිය අනුව සිදුකර තිබේ. ඒ අනුව උසස් කුලයේ අයට ඉහළ යැයි සම්මත සහ පහත් කුලවල අයට පහළ යැයි සම්මත සේවාවන් පවරා තිබේ. මෙහිදී කුල ක්‍රමයේ දක්නට ලැබෙන ධුරාවලි රටාව වර්තමාන මහා දේවාල පෙරහැර මඟින් තව දුරටත් විද්‍යාමාන වේ. එසේම විවිධ කුල වලට අයත් මිනිසුන් දේවාලයේ ඉඩම්වල පදිංචි කරවීම මඟින් දේවාලයේ බහු කාර්ය කොටස් හා සේවා ඉටු කරවා ගැනීම අපේක්ෂා කර ඇත. රාජකාරි ක්‍රමය මගින් ඉඩම් ලාභින් සහ දේවාලය අතර අන්‍යෝන්‍ය බැඳීමක් ගොඩනගා තිබෙන අතර මෙම පසුබිම තුළින් රාජකාරි සේවාව පැහැර හැරීය නොහැකි අනිවාර්ය දෙයක් බවට පත්කර ඇත. එසේම කුලයට අදාල ආරෝපිත වෘත්තීන් මහා දේවාලයේ නඩත්තුවට සම්බන්ධ කර ගැනීමේ දී රාජකාරි සේවාව ට යටත්ව ඉඩම් පැවරීමේ ක්‍රමෝපාය වැදගත් සාධකයක් වී තිබේ. ඒ අනුව කුල ක්‍රමය තුළ ආරෝපිත වෘත්තියක් පැවතීම යන කාරණය ස්ථාවර එකක් බව මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

වර්තමානය වන විට දේවාලය හා සම්බන්ධ රාජකාරි සේවාවේ සමහර සේවා ඊට අදාල පුද්ගලයන් විසින් වෙනත් අයට විතැන් කර තිබේ. මේ සඳහා පවුලේ සාමාජිකයන්ගේ රැකියා නියුක්තිය හා අධ්‍යාපන මට්ටම හා සමහර රාජකාරි සේවා ඉටු කිරීම ලැජ්ජාවට හේතුවක් ලෙස සැලකීම (හුණු පිරියම් කිරීම, පිරිසිදු කිරීම වැනි) යනාදිය බලපා තිබේ. එමෙන් ම සමහර සේවා කිරීමේ දී ඊට වැඩි කාලයක් ගත වීම (තොරණ බැඳීම වැනි) නිසා ඒවා වෙනත් අය වෙත පවරා ඇත.

එබැවින් මේ වන විට කුලය හා බැඳුණු සමහර රාජකාරි සේවා කුලයෙන් පිටස්තර අය අතට පත්වීම සහ එම කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් මුදල් අය කිරීම සිදුවී තිබේ. මේ නිසා වර්තමානයේ මහා දේවාල පෙරහැරේ සමහර රාජකාරිය සේවයට අයිති වැඩ වාණිජකරණයට හසුවී තිබීම නව ප්‍රවණතාවකි. කෙසේ නමුත් පෙරහැර මංගල්‍යයෙන් විද්‍යාමාන රාජකාරි සේවා ක්‍රමය ස්ථාවර එකක් වන අතර එය ඉටු කිරීමේ ස්වභාවය පමණක් වෙනස් වී තිබේ. රාජකාරිය හෙවත් දේවාලයට ඉටුකළ යුතු සේවය පැහැර හැරිය නොහැකි එකක් යැයි පීරිස් (2005) විසින් ‘රාජකාරිය දේවකාරියක්’ ලෙස පවසන අදහස මෙම අධ්‍යයනයෙන් තව දුරටත් සනාථ වේ. කෙසේ නමුත් තමන් විසින් හෝ අන් අයෙකු ලවා හෝ රාජකාරි සේවය ඉටු කිරීමට ක්‍රියා කිරීමෙන් රාජකාරි ක්‍රමය තව දුරටත් පිළිගන්නා එකක් බවට පත්වීම නිසා එහි ස්ථාවර බව ආරක්ෂා වී ඇත.

මුන්නේශ්වරම මහා දේවාල පෙරහැර අදියර දෙකකින් පැවැත්වීම වර්තමානයේ දක්නට ලැබෙන නව ප්‍රවණතාවකි. පළමු අදියරේ පවත්වන පෙරහැර කුලය, ඉඩම් අයිතිය හා රාජකාරි සේවය සමඟ බැඳුණු මිනිසුන්ගේ දායකත්වයෙන් සිදුකරන එකකි. මෙම අවස්ථාවේ දී මිනිසුන් මහා දේවාලය ට ඇති රාජකාරි සේවාමය බැඳීම නිසා පෙරහැරට සම්බන්ධ වෙයි. පොදුවේ විවිධ කුල නියෝජනය කරන මිනිසුන් පෙරහැර පැවැත්වීමට සම්බන්ධ වුවද, ආරෝපිත වෘත්තිමය තත්ත්වය නිසා ඔවුනොවුන් අතර අන්තර් සම්බන්ධයක් ගොඩනැඟී නැත. සිය සේවාව පමණක් අවධානයට ගැනීම නිසා එක් එක් කුල අතර පවතින අසමානතාව තව දුරටත් නොවෙනස් ව තිබේ. මෙය මහා දේවාල පෙරෙහැරේ දක්නට ලැබෙන ස්ථාවර තත්තවයකි. එබැවින් කුල ක්‍රමය හා සම්බන්ධ සමාජ සංවිධනය මඟින් එක් පැත්තකින් කුලය තුළ සමීප සහ සමානාත්මතාවය මුල්කොට ගත් අන්තර් සම්බන්ධතා තහවුරු

කරන්නේ ය (සිල්වා 199)) යන අදහස මෙම අධ්‍යයනයෙන් තහවුරු වේ. එසේම සමහර කුල (ජාති) වලට අයිති රැකියා (පාවඩ එලීම, රථ ඇදීම, තොරණ් බැඳීම වැනි) නැවත බලගැන්වීම පෙරහැර ට සහභාගි වීමෙන් සිදුවී ඇත. මිනිස්සු පොදුවේ අධ්‍යාත්මික තත්ත්වයන් කෙරෙහි වැඩි විශ්වාසය ඇතිව ක්‍රියා කිරීමේ දී කුල ක්‍රමයෙන් පිළිබිඹු කෙරෙන අසමානතාව ඔවුන්ගේ අවධානයෙන් ගිලිහී ගොස් තිබේ. එසේම කුල ධුරාවලියේ පහළ ස්තරයේ බොහෝ අයගේ හැසිරීමේ පවතින සරල බව, පක්ෂපාතී බව මෙන්ම දරිද්‍රතාව ආදි ගති ලක්ෂණය නිසා එම අය සෙසු සමුහයෙන් වෙනස් කොට හදුනා ගැනීම පහසු කර තිබේ.

දෙවන අදියර සැලකීමේ දී එය අලුතින් පැවැත්වෙන පෙරහැර හා සම්බන්ධ වෙයි. සමාන්‍යයෙන් අතීතයේ පටන් පැවැත එන මුන්නේශ්වරම මහා දේවාල පෙරහැර දිය කැපීමෙන් අවසන් වී තිබේ. නමුත් ධනවත් පුද්ගලයන්ගේ මැදිහත් වීම නිසා පළමු පෙරහැර ට ඇතුළත් වු නවාංගයක් ලෙස දෙවන අදියරේ පෙරහැර උත්සවය පැවැත්වෙයි. මෙය වත්මන් පෙරහැරේ දැකිය හැකි නව ප්‍රවණතාවකි. මෙම පෙරහැර ට කුලය, ඉඩම් හා රාජකාරිය මත බැඳුණු සේවාව අත්‍යවශ්‍ය නොවේ. නව පෙරහැරේ මුලිකත්වය ගෙන කටයුතු කරන ව්‍යාපාරිකයන් සාමාන්‍ය ප්‍රජාව අතර වැඩි පිළිගැනීමකට භාජනය වී තිබේ. පෙරහැර අවස්ථාවක් ලබා ගැනීම දුෂ්කර කාර්යයක් වීම සහ වැඩි මුදලක් වැය කළ යුතුවීම ඊට හේතුවේ. ඒ අනුව නව පෙරහැර පැවැත්වීම මඟින් පන්ති ධුරාවලියේ ඉහළ ස්තරය නියෝජනය කරන්නන් තව දුරටත් ඉස්මතු කර තිබේ. එසේම නව පෙරහැර ට ශ්‍රමය සපයන වැඩි පිරිසක් කුල ධුරාවලියෙන් පහළ අය වන අතර ඔවුන්ගේ ශ්‍රම සැපයුම වෙනුවෙන් දෛනිකව මුදලින් ගෙවීම් සිදු කෙරේ. එබැවින් දෙවියන් හා සම්බන්ධ ආගමික පෙරහැර සදහා ශ්‍රම සැපයුම නොමිළේ කරන එකක් වෙනුවට මුදලට තීරණය වීමේ නව ප්‍රවණතාව දක්නට

ලැබේ. මෙහිදී කුල ධුරාවලියේ පහළ තලය නියෝජනය කරන්නන්ගේ රාජකාරි සේවය ලෙස සම්ප්‍රදායික ස්ථාවර පිළිගැනීම් අභියෝගයට ලක්කර ඇත. අනික් අතට පළමු සහ දෙවන අදියර වශයෙන් පැවැත්වෙන පෙරහැර අවස්ථා දෙක අතර තරඟකාරී බවක් ඉස්මතු වීම දැකිය හැකි නව ප්‍රවණතාවකි.

එමෙන් ම පෙරහැරේ පළමු අදියරේ දී කුල ක්‍රමයත් දෙවන අදියර මඟින් පන්ති ක්‍රමයත් දක්නට ලැබේ. මේ තත්ත්වය ඉදිරියේ දී කුලය, ඉඩම් අයිතිය හා රාජකාරි සේවාව හා බැඳුණු සම්ප්‍රදායික පෙරහැර මංගල්‍යය ට අභියෝගයක් ඇතිවිය හැකිය. කෙසේ නමුත් පෙරහැරට සම්බන්ධ උසස් බ්‍රාහ්මණ වංශිකයන් සතු සේවාවන් නොවෙනස් ව තිබෙන අතර එම සේවාවන් එම කුලයෙන් පිටස්තර කෙනෙකුට පැවරිය නොහැකි වීම ඊට බලපා තිබේ. ඒ අනුව කුල (ජාති) තත්ත්වයෙන් පහත් අය පහළ යැයි සම්මත සේවාවන් වල නියැළීම සහ කුල තත්ත්වයෙන් උසස් අය ඉහළ යැයි සම්මත සේවාවන් වල නිරත ව සිටිති. මෙය පෙරහැර මංගල්‍යයේ දැකිය හැකි ස්ථාවර ලක්ෂණයකි. ඒ අනුව මහා දේවාලයේ කාර්යයන් සහ පෙරහැර මංගල්‍යයේ සේවා සැපයීම කුල ධුරාවලියේ පවතින උසස් හා පහත් යන තත්ත්ව පිළිවෙළ සැලකිල්ලට ගනිමින් සිදුකර තිබෙන අතර මෙයින් කුල ධුරාවලිය තවදුරටත් තහවුරු කර තිබේ.

එමෙන් ම මිනිස්සු විවිධ අරමුණු ඇතිව මහා දේවාලය ට භාර වන අතර වාර්ෂික පෙරහැර මංගල්‍යයට සහභාගි වීම මඟින් සමහර භාර ඔප්පු කරනු ලබයි. මේ මඟින් දෙවියන් පිළිබඳව මිනිස්සු තුළ තිබෙන විශ්වාසය හා භක්තිය තව දුරටත් වර්ධනය කර ගැනීමට අවස්ථාව ලැබී තිබේ. මෙම භාර ඔප්පු කිරීමේ ක්‍රියාවලිය මඟින් කුල සාධකය, ඉඩම් අයිතිය හා රාජකාරි සේවය යන අංගයන්ගෙන් බැහැර ව වෙනත්

පිටස්තර පිරිසක් ද පෙරහැර උත්සවයට සක්‍රීයව සම්බන්ධ වී ඇත. මේ මඟින් පෙරහැරේ විවිධ ජනවර්ග නියෝජනය තව දුරටත් වැඩිවන අතර දිගු කාලීන යුධ ගැටුමට මැදි වූ සමාජයක වාර්ගික සහජීවනය ගොඩ නැඟීමට මෙය ඉවහල් වී තිබේ. එසේ ම සිංහල, දමිළ ජන කණ්ඩායම් දෙක අතර පවතින අවිශ්වාසය බැහැර කොට විශ්වාසය දිනා ගැනීමට අවශ්‍ය කෙරෙන පසුබිම පෙරහැර මංගල්‍යය තුළින් සැකසී තිබේ. පශ්චාත් යුධ පසුබිම් සමාජයක නැවත ගැටුම් ඇතිවීම වළක්වා ගැනීමට අන්‍යෝන්‍යමය ලෙස ගොඩනැගෙන මෙම ජනවාර්ගික සම්බන්ධතාව වඩාත් වැදගත් වේ.

**ඇමුණුම -1**

# ශ්‍රී මුන්නේශ්වරම් දේවස්ථානම්

## 2022 වාර්ෂික නිකිණි මහා උත්සවය

| | | | |
|---|---|---|---|
| අගෝස්තු | 14 ඉරිදා | කප් සිටුවීම | මරුදන්කුලම් වේලප්පු විදානයාර් උත්සවය<br>රාත්‍රී මුන්දල් කේ. සුප්පියාපිල්ලේ මහතාගේ උත්සවය |
| අගෝස්තු | 15 සඳුදා | 02 වන දින පෙරහැර | 2 වන දින දේවාලය ඇතුලේ උත්සවය<br>රාත්‍රී මුන්දල් කේ. සුප්පියාපිල්ලේ මහතාගේ උත්සවය |
| අගෝස්තු | 16 අඟහරුවාදා | 03 වන දින පෙරහැර | 1 වන දින අඹ ගහ විදිය උත්සවය<br>රාත්‍රී මුන්දල් කේ. සුප්පියාපිල්ලේ මහතාගේ උත්සවය |
| අගෝස්තු | 17 බදාදා | 04 වන දින පෙරහැර | 2 වන දින අඹ ගහ විදිය උත්සවය<br>රාත්‍රී මුන්දල් කේ. සුප්පියාපිල්ලේ මහතාගේ උත්සවය |
| අගෝස්තු | 18 බ්‍රහස්පතින්දා | 05 වන දින පෙරහැර | 3 වන දින අඹ ගහ විදිය උත්සවය<br>රාත්‍රී මුන්දල් කේ. සුප්පියාපිල්ලේ මහතාගේ උත්සවය |
| අගෝස්තු | 19 සිකුරාදා | 06 වන දින පෙරහැර | මරදන්කුලම ආරාච්චියාර් උත්සවය |
| අගෝස්තු | 20 සෙනසුරාදා | 07වන දින පෙරහැර | මනක්කුලම උත්සවය |
| අගෝස්තු | 21 ඉරිදා | 08 වන දින පෙරහැර | කාක්කාපල්ලිය සහ සේමාසිරුප්පුව උත්සවය |
| අගෝස්තු | 22 සඳුදා | 09 වන දින පෙරහැර | සියඹලගස්වෙල සහ පම්බල උත්සවය |
| අගෝස්තු | 23 අඟහරුවාදා | 10 වන දින පෙරහැර | පොන්නාංකන්නිය සහ පහලගම උත්සවය |
| අගෝස්තු | 24 බදාදා | 11 වන දින පෙරහැර | කරවිට උත්සවය |
| අගෝස්තු | 25 බ්‍රහස්පතින්දා | 12 වන දින පෙරහැර | ඉනිගොඩවැල උත්සවය |
| අගෝස්තු | 26 සිකුරාදා | 13 වන දින පෙරහැර | මුන්නේස්වරම් උත්සවය |
| අගෝස්තු | 27 සෙනසුරාදා | 14 වන දින පෙරහැර | පිරප්පන්කුලිය සහ පහලගම උත්සවය |
| අගෝස්තු | 28 ඉරිදා | 15 වන දින පෙරහැර | කිරියන්කල්ලිය අක්කරවෙලි හින්දු ගම් වැසියන්ගේ උත්සවය |
| අගෝස්තු | 29 සඳුදා | 16 වන දින පෙරහැර | ශ්‍රී ලංකා හින්දු මලයාල මහජන සභාවේ උත්සවය |
| අගෝස්තු | 30 අඟහරුවාදා | 17 වන දින පෙරහැර | කුසල කරුකුපනේ සහ කොට්ටගගෙ උත්සවය |
| අගෝස්තු | 31 බදාදා | 18 වන දින පෙරහැර | මුන්දල් කේ.සුප්පියාපිල්ලේ මහතාගේ උත්සවය |
| සැප්තැම්බර් | 01 බ්‍රහස්පතින්දා | 19 වන දින පෙරහැර | සුරුවිල උත්සවය |
| සැප්තැම්බර් | 02 සිකුරාදා | 20 වන දින පෙරහැර | ගල්මුරුව හේරත් ගුණරත්න මුහන්දිරම් මහතාගේ උත්සවය<br>සවස **ශ්‍රී ගණදෙවි උත්සවය** මාදම්පේ රාසයියා මහතාගේ(රාජුමුදලාලි) උත්සවය |
| සැප්තැම්බර් | 03 සෙනසුරාදා | 21 වන දින පෙරහැර | තිස්සෝගම සහ මයිලයියා නාඩාර් උත්සවය<br>සවස **කතරගම දෙවි** උත්සවය කුරුසාමි රවි (අනුසුයා ජුවල් හවුස් හලාවත) මහතාගේ උත්සවය |
| සැප්තැම්බර් | 04 ඉරිදා | 22 වන දින පෙරහැර | මරදන්කුලම උත්සවය<br>සවස **මහා විශ්ණු උත්සවය** හලාවත අජන්තා ජිවල් හවුස් V.කුහදාසන් මහතාගේ උත්සවය |
| සැප්තැම්බර් | 05 සඳුදා | 23 වන දින පෙරහැර | සවස **ගිණිපැගීම උත්සවය** සහ රාත්‍රී 63 බැතිමතුන්ගේ උත්සවය ආරච්චිකට්ටුව තම්බයියා ඔවයිසර් මහතාගේ පෙරහැර |
| සැප්තැම්බර් | 06 අඟහරුවාදා | 24 වන දින පෙරහැර | සවස **භික්ෂාඩන උත්සවය** පිච්චන් චෙට්ටියාර් මහතාගේ උත්සවය රාත්‍රී මරදන්කුලම ආරච්චියාර් සහ උඩප්පුඅම්බලකාර උත්සවය |
| සැප්තැම්බර් | 07 බදාදා | 25 වන දින පෙරහැර | සවස **නඩේසර් උත්සවය** කොළඹ මඩමේ Dr.K.පසුපතිරාජා මහතාගේ උත්සවය, රාත්‍රී උඩප්පු නල්ලාරක්කු සම්මාටියාර්ගේ උත්සවය |
| සැප්තැම්බර් | 08 බ්‍රහස්පතින්දා | 26 වන දින පෙරහැර | සවස **අඹ විදින උත්සවය** කේ.කුමාර රත්තිනම් මහතාගේ උත්සවය, රාත්‍රී උඩප්පු ගම් වැසියන්ගේ උත්සවය |
| සැප්තැම්බර් | 09 සිකුරාදා | 27 වන දින පෙරහැර | දහවල් **මහා රථෝත්සවය** එම් .රාජනාදන් සහ පවුලේ උත්සවය රාත්‍රී තිමල ආන්ඩියප්පු ගමරාල මහතා සහ උඩප්පු රාමලිංගම් මහතාගේ උත්සවය |
| සැප්තැම්බර් | 10 සෙනසුරාදා | 28 වන දින පෙරහැර | දහවල් **දිය කැපීම උත්සවය** ආර්.එස්.කෝනේසර් මහතාගේ උත්සවය රාත්‍රී හලාවත හින්දු තරුණ සභාවේ උත්සවය |
| සැප්තැම්බර් | 12 සඳුදා | උදේ **කිරිකල උත්සවය** | හලාවත ලක්ෂ්මි ස්ටුඩියෝ ඒ.එම්.ලක්ෂ්මන් සෙර්වයිමහතාගේ උත්සවය සවස් මංගල උත්සවයහලාවත නිව් නදියා ජුවලරි මාර්ට් කේ.රාජදුරේයි මහතාගේ උත්සවය |
| සැප්තැම්බර් | 13 අඟහරුවාදා | රාත්‍රී **සන්ඩේස්වරර් උත්සවය** | හලාවත නිව් නදියා ජුවලරි මාර්ට් කේ.රාජදුරේයි මහතාගේ අසිනෙක උත්සවය |
| සැප්තැම්බර් | 14 බදාදා | උදේ **ප්‍රායචිත්ත පූජාව** | කොළඹ නන්දන විදුරවන් මහතාගේ උත්සවය |
| සැප්තැම්බර් | 15 බ්‍රහස්පතින්දා | රාත්‍රී ** භෛරව පූජාව** | මීගමුව බ්‍රහ්මශ්‍රී R.ජෙගදීශ්වර සර්මාගේ උත්සවය |

Printed Mathi Colours, Nallur. 0212229285

**ආශ්‍රිත ග්‍රන්ථ**

ඩේවිඩ්, පී. අයි. (2012). හලාවත බෞද්ධ උරුමය හලාවත: ප්‍රින්ට් X

ධර්මදාස, කේ. එන්. ඕ. හා තුන්දෙනිය, එච්. එම්. එස්. (1994). සිංහල දේව පුරාණයඃ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව. කොළඹ

පීරිස්, ආර්. (2005). සිංහල සමාජ සංවිධානය (තෙවන මුද්‍රණය) බොරගස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ

විජේරත්න, ආර්. (2013). අසිරිමත් දෙව්පුර, විලත්තව: පන්නිල ක්‍රියේෂන්ස්

වජිර හිමි, කඹුරුගමුවේ (2008). දළදා ඉතිහාසය සහ සංස්කෘතිය, කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ

සුමේධ හිමි, තල්ගහවෙල (2020). පුත්තලම දිසාවේ ඓතිහාසික බෞද්ධ උරුමය සොයා, දන්කොටුව: වාසනා මුද්‍රණාලය

සිල්වා, කේ. ටී. (1997). කුලය පන්තිය හා වෙනස්වන ලංකා සමාජය මහනුවර: ප්‍රජා අධ්‍යයන කවය

සිල්වා, කේ. ටී. (2005). කුලය, පන්තිය සහ ලංකාවේ සමාජ ගැටුම්, බොරගැස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ

හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, (2020). සම්පත් පැතිකඩ හලාවත: ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

Adikaram, E.W. (1946). Early History of Buddhism in Ceylon: Gunasena Printers, Colombo

Ahuja, R. (1997). ‘Urbanization’ Social Problemes in India. Jaipur: Rawat Publication

Bastin, R. (2002). The Domain of Constant Excess: Plural Worship at the Munnesvaram Temples in Sri Lanka, New York: Berghahn

De Silva, S.B.D. (1982). Political Economy of Underdevelopment, London: Routledge and Kegan Paul Ltd

De Silva, P. (2013). (Re) ordering of postcolonial Sri Pada in Sri Lanka: Buddhism, state, and nationalism. In History and Sociology of South Asia *7:2*

Durkheim, E. (1915). The Elementary Forms of Religious Life, (Translation by Joseph Swain), London: George Allen & Ulwin Ltd

Gombrich, R. F. and Obeyesekere, G. (1988). Buddhism Transformed: Religious Change in Sri Lanka, Princeton: Princeton University Press

Gombrich, R. (1971). Precept and Practice. Traditional Buddhism in the Rural Highlands in Ceylon. London: Clarendon Press.

Holt, J. C. (2006). Hindu Influences on Medieval Sri Lankan Buddhist Culture. In Buddhism, Conflict and Violence in Modern Sri Lanka (ed) D. Mahinda. London: Routledge

Leach, E.R. (1960). 'Introduction: What should we mean by caste?' in E.R. Leach eds. Aspect of caste in South India, Ceylon and Northwest Pakistan. Cambridge: Cambridge University Press

Lundberg, G. A. (1964). Foundations of Sociology. United state: David McKay

Merrill, F. E. (1957). Culture and Society: an Introduction to sociology. Englewood Cliffs N.J.: Prentice Hall, INC

Obeyesekere, G. (1984). The Cult of Goddess Pattini, Chucago, University of Chicago Press

Pfaffenberger, B. (1979). The Kataragama Pilgrimage: Hindu Buddhist Interaction and Its Significance in Sri Lanka's Polyethnic Social Syatem. The Journal of Asia

Radcliffe- Brown, A.R. (1922). The Andaman Islanders, New York: Free Press of Glencoe

Sarma B.S. (2007). History of Munneshwaram Temple, Dehiwala: Sri Sankar Publication

Seneviratne, H. L. (1978). Rituals of the Kandyan State. Cambridge: Cambridge University Press

Seneviratne, H.L. (2002). Buddhism, Identity and Conflict. Colombo: International Centre for Ethnic Studies.

Shanmugalingam, N. (2002). A New Face of Durga: Religious and Social Change in Sri Lanka, New Delhi: Kalinga

Spencer, J. et al.(2014). Checkpoint, Temple, Church and Mosque: a collaborative ethnology of war and peace, London: Pluto

Somaskanda Kurakkal B, M. (2016). The Sacred History of Sri Munneswara, Padmanaban B.S (edit.), Chilaw: Sri Munneswaram Devasthanam.

Tambiah,S.J. (1992). Buddhism Betrayed?. Religion, Politics and Violence in Sri Lanka. Chicago: Chicago University Press.

Whitaker, M. (1999). Amiable incoherence: manipulating histories and modernities in a Batticaloa Hindu Temple, 302. Amsterdam: V.U. Press.

https://en.wikipedia.org/wiki/Munneswaram_temple